# සංස්කෘත භාෂාව

## 12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය
(2017 සිට ක්‍රියාත්මක වේ)




සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 12 වැනි ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

**සංස්කෘත භාෂාව**

**ගුරු මාර්ගෝපදේශය**

**12 වැනි ශ්‍රේණිය**

**ප්‍රථම මුද්‍රණය 2017**

**© ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk

**විද්‍යුත් තැපෑල** : info@nie.lk

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරතවීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ඕම්! ගුරු බ්‍රහ්මා, ගුරු විෂ්ණු, ගුරු දේවෝ, මහේශ්වරඃ
ගුරු සාක්ෂාත්, පරබ්‍රහ්මා, තස්මෛ ශ්‍රී, ගුරවේ නමඃ

ගුරු අබිමුවෙහි හිඳ ගුරු මුඛයෙන් සිප් සතර හදාරන්නට සැරසෙන මානවකයා තම ගුරු දෙවි නමස්කාර කරනු වස් සජ්ඣායනය කරනු ලබන ඉහත ගුරු වන්දනා ස්තෝත්‍රය අප උගත්තේ සංගීත ශිල්පය හා බැඳි ව ය. එහි බස සංස්කෘතය යි. උච්චාරණය අතිගම්භීර යී. එම නිසා ම ගුරුවරයා හා ශිල්පය කෙරෙහි අත්‍යන්ත භක්තියක්, විශ්වාසයක් හා ගෞරවයක් සිසු හදේ නිරායාසයෙන් ජනිත වෙයි.

එනයින් බලන කල සංස්කෘත භාෂාව සංගීතය, නර්තනය, චිත්‍ර, නාට්‍ය යන ලලිතකලාවන් හි සම්භාව්‍ය, ගැඹුරු ආස්වාදනීය හා අධ්‍යාත්මික ගුණය පළ කරන්නට සපයා ඇත්තේ ඉමහත් පිටිවහලකි. විදු පියසෙහි අප දරුවන් හදාරන සෑම විෂයයක් මඟින් ම උතුම් මානව ගුණ අත්පත් කර ගෙන යහගුණ සපිරි ගුරු සිසු සබඳතාවක් ගොඩනගන්නට වසර තුන් හාර දහසක් ඉපැරණි මෙවන් වටිනා ශ්ලෝක පාසලේ පොදු ඉගෙනුම් සම්පත් බවට පත්විය යුතු යැයි හඟිමි. එබැවින් අවසන් විභාගයකට අගැයීමට විෂයයක් වශයෙන් හදාරන්නට පෙරාතු ව, වටිනා සංස්කෘත ශ්ලෝක පාඨ කිහිපයක් වත් පොදුවේ දරුවන් පාසලින් ලැබුණහොත් ඉගෙනුමෙහි අග්‍රඵලය ලෙස අත්පත් කර ගන්නා ශික්ෂාකාමී, විනයගරුක බව තැන්පත් බව එම ජීවිතවලට එකතු කර ගන්නට අප ඔවුනට අවස්ථාව උදා කර දෙනු ඇත. වර්තමානයේ මෙවැනි සම්භාව්‍යය භාෂා මෘත භාෂා ලෙස හඳුන්වන්නේ මෙබස යුරෝපීයන් පවා පිළිගන්නා බැව් නොදන්නෝ විය හැක.

"Sanskrit is the greatest language of the world"
-Friedrich Max Muller (Philologist & Orientalist)-

සංස්කෘතය ලෝකයේ ඉහළ ම ප්‍රාචීන සම්භව්‍යය භාෂාවක් ලෙස ජර්මන් ජාතිකයකු වූ මෙවන් පඬිවරයකු පවා පිළිගනිත් දී සංස්කෘතය අසලින් ම ඇති හෙළ බස වහරන අප ඉන් කොතරම් ආලෝකයක් අපගේ භාෂා ඉගෙනුමට ලැබිය යුතු ද? එම නිසා හෙළ බසෙහි අගය තව තව අපේ දරුවන්ට දැනෙන්නට මෙන් ම, හෙළ බස වඩාත් නිවැරදි ව හා ශක්තිමත්ව වහරන්නට, යොදන්නට සංස්කෘත භාෂාව ඉගෙනුමෙහි උනන්දුව වැඩි දියුණු කිරීම අප විසින් කළ යුතු ය.

ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය, විසින් සංස්කෘත භාෂා විෂයය සඳහා සකසන ලද උසස් පෙළ විෂය නිර්දේශය හා ගුරු අත්පොත, අප සතුව ඇති ඉතා අල්ප වූ සුවිශේෂි විෂය පිළිබඳ ප්‍රවීණයන්ගේ දායකත්වයෙන් ඉටු කරන ලද උතුම් ජාතික මෙහෙවරක් ලෙස මම අගයමි. මෙම ජාතික කාර්යය හරවත් ව, ඵලවත් ව ඉටු කිරීමට දායක වූ සැමට මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

**සංගීත විශාරද, ශාස්ත්‍රපති සුදත් සමරසිංහ**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,**
**ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය** - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය විශේෂඥ උපදේශනය** මහාචාර්ය වෝල්ටර් මාරසිංහ (සංස්කෘත විෂය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය)

**විෂය සම්බන්ධීකරණය** - පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), අංශ ප්‍රධාන, සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

### ලේඛක මණ්ඩලය

**අභ්‍යන්තර**

01. පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, (විශිෂ්ට පන්ති) පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, (විශිෂ්ට පන්ති) පශ්චාද් උපාධි උපදේශන ඩිප්ලෝමා, අධ්‍යාපනපති) ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**බාහිර**

02 මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි (අංශාධිපති) (රාජකීය පණ්ඩිත, ආචාර්ය) සංස්කෘත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

03 ආචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) (රාජකීය පණ්ඩිත, ආචාර්ය) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාතනය, කැලණිය විශ්වවිද්‍යාලය.

04 පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි (සංස්කෘත විෂය උපදේශක) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති) පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

05 පූජ්‍ය නිග්ගහ ඤාණින්ද හිමි (කථිකාචාර්ය) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා) සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය - අවිස්සාවේල්ල.

06 පූජ්‍ය අටබාගේ ධම්මාලෝක හිමි (ගුරු උපදේශක) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා) ම/ආනන්ද මූලික පිරිවෙන, ඉහලගම, අටබාගේ. මහඋඩගම.

07 පූජ්‍ය විදුරුපොල ආනන්ද හිමි (පරිවේණාධිපති) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රවේදී, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා) කො/දක්ෂිණාරාම ද්විභාෂා මූලික පිරිවෙන, මල්වත්ත, දකුණු හෝකන්දර, හෝකන්දර.

08 පූජ්‍ය මල්අස්නේ තිලකවංස හිමි (පරිවේණාචාර්ය), (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති) ගම්/සිරි සුමංගල මහ පිරිවෙන, වලලියද්ද, එල්ලක්කල.

09 මහාචාර්ය වෝල්ටර් මාරසිංහ, (විශ්‍රාමික මහාචාර්ය), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.

10 ඒ.කේ.එච්. ධර්මප්‍රිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාතනය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

11 එම්.ඒ.ඩී.පී.පී. හපුආරච්චි (ගුරු උපදේශක), (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා) කු/විසුද්ධායතන විද්‍යායතන පිරිවෙන, කච්චේරිය පාර, කුරුණෑගල.

විෂය සංස්කරණය - මහාචාර්ය වෝල්ටර් මාරසිංහ (සංස්කෘත විෂය පිළිබඳ විශ්‍රාමික මහාචාර්ය)
යතුරු ලියනය පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි (සංස්කෘත විෂය උපදේශක)
කවර නිර්මාණය - අජිත් පනාපිටිය, කැ/පිංදෙණිය මධ්‍ය මහා විද්‍යාලය, අටාල.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සංස්කෘත භාෂාව, පාසල් හා පිරිවෙන් තුළ ප්‍රචලිත කිරීමේ උදාර අරමුණෙන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ 12 ශ්‍රේණියේ මෙම ගුරු මාර්ගෝපදේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. ශිෂ්‍යයා කෙරෙහි වඩාත් පරිපූර්ණ ශික්ෂණයක්, විචාරපූර්ව චින්තනයක්, ප්‍රගතිශීලී නිර්මාණ කෞශල්‍යයක් උත්පාදනය කිරීම මේ මඟින් අපේක්ෂා කෙරේ. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතිවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ ගලන්නේ නැතිවා සේ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකිය. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා ම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. ඒ අනුව මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට (අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩයේ සිට) සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

2007 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයකු ලෙස ඔබ මේ වනවිටත් හොඳ අවබෝධයක් ලබා ඇත. යම් විෂයක් පිළිබඳ සිසුන් නිපුණයන් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරි ව යෙදිය යුතු ය. තමා උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝග ආකාට යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2017 වර්ෂයේ සිට ඔබ භාවිත කරන මෙම ගුරු මාර්ගෝපදේශය මඟින්, දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එක ම අරමුණ නොවිය යුතු වේ. ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයක් වනු ඇත. අධ්‍යාපනයෙන්, විභාග සමත්වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

සංස්කෘත විෂය නිර්දේශයෙහි 12 ශ්‍රේණිය සඳහා නිපුණතා 10ක් දක්වා ඇති අතර පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ පහසුව සඳහා ඒවා නිපුණතා මට්ටම් (පියවර) 35 කට බෙදා ඇත. ඒ සඳහා ගුරු මාර්ගෝපදේශයේ පාඩම් ඒකක 31 ක් දක්වා ඇත. සැම ආදර්ශ පාඩම් ඒකකයක් ම ඉගෙනුම් පල ගණනාවකින් සමන්විත වන අතර එම ඉගෙනුම් පල අත් කර ගත හැකි ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය පන්ති කාමරය තුළ සිදු කළ යුතු ය. ගුණාත්මක යෙදවුම් භාවිත කරමින් යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කරගැනීමෙන් පසු සිසුන්ට ඉගෙනුම් පල අත් කර ගැනීමට හැකි වූ ප්‍රමාණය තක්සේරු කර බැලීම ද පාඩම් ඒකකය අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දි සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලි ක්‍රමයක් භාවිත කිරීමට ගුරු භවතාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය. මෙම ගුරු මාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නොඉක්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ඔබට අවකාශ ඇත. ගුරු මාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ගුරු කොට නිපුණතා 10 ආවරණය වන පරිදි 12 ශ්‍රේණියේදී ඇගයීම් 09 ක් සිදු කළ යුතු ය. ඒ සඳහා විස්තර පාසල පදනම් කරගත් තක්සේරුකරණය කොටසේ දක්වා ඇත.

රාජකීය පණ්ඩිත, අධ්‍යාපනපති පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි.
(ව්‍යාපෘති ප්‍රධාන හා අධ්‍යයන අංශප්‍රධාන)

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| 03 | විෂයමාලා කමිටුව | v |
| 04 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 05 | පටුන | vii |
| 06 | විෂය හැඳින්වීම | viii |
| 07 | ජාතික අරමුණු | ix |
| 08 | මූලික නිපුණතා | x |
| 09 | විෂය අධ්‍යයනයේ අරමුණු | xi |
| 10 | විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම | xiii |
| 11 | විෂය නිර්දේශය | xiv |
| 12 | පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xv |
| 13 | තක්සේරුව හා ඇගයීම | xxii |
| 14 | ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | xxiii |
| | | xxiv |
| 15 | 1. ඒකකය - සංස්කෘත වර්ණමාලාව හා එහි වර්ගීකරණය | 01 |
| 16 | 2. ඒකකය - පිලි හා සංයුක්තාක්ෂර භාවිතය | 03 |
| 17 | 3. ඒකකය - සංස්කෘත වචන භාවිතය | 05 |
| 18 | 4. ඒකකය - පද වර්ග | 06 |
| 19 | 5. ඒකකය - පද යෝජනය | 08 |
| 20 | 6. ඒකකය - ලිඞ්ග, විභක්ති හා කාරක | 10 |
| 21 | 7. ඒකකය - සන්ධි ප්‍රභේද | 12 |
| 22 | 8. ඒකකය - ධාතු ගණ හා ලකාර | 14 |
| 23 | 9. ඒකකය - තද්ධිත | 18 |
| 24 | 10. ඒකකය - කෘදන්ත | 20 |
| 25 | 11. ඒකකය - සමාස | 21 |
| 26 | 12. ඒකකය - ප්‍රත්‍යයාර්ථ ක්‍රියා | 23 |
| 27 | 13. ඒකකය - අව්‍යය පද | 25 |
| 28 | 14. ඒකකය - අර්ථාවබෝධය (නිර්දිෂ්ට ගද්‍ය) | 27 |
| 29 | 15. ඒකකය - අර්ථාවබෝධය (නිර්දිෂ්ට පද්‍ය) | 28 |
| 30 | 16. ඒකකය - සාහිත්‍ය නිර්මාණ | 29 |
| 31 | 17. ඒකකය - සාහිත්‍ය රසාස්වාදය | 30 |
| 32 | 18. ඒකකය - සාරධර්ම හඳුනාගැනීම | 31 |
| 33 | 19. ඒකකය - සාරධර්ම ඇගයීම | 33 |
| 34 | 20. ඒකකය - භාෂණයේ යෙදීම ( ප්‍රශ්න හා පිළිතුරු ) | 35 |
| 35 | 21. ඒකකය - භාෂණයේ යෙදීම (සංවාද) | 37 |
| 36 | 22. ඒකකය - ගද්‍ය, පද්‍ය පාඨ අර්ථාවබෝධය | 39 |
| 37 | 23. ඒකකය - සවන් දී නිවැරැදි ව ප්‍රතිචාර දැක්වීම | 40 |
| 38 | 24. ඒකකය - ආගමික පරිසරය | 41 |
| 39 | 25. ඒකකය - අධ්‍යාපන පසුබිම | 43 |
| 40 | 26. ඒකකය - නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය | 45 |
| 41 | 27. ඒකකය - මාධ්‍ය භාෂාගත නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය | 47 |
| 42 | 28. ඒකකය - වෛදික සාහිත්‍යය | 49 |
| 43 | 29. ඒකකය - වීරකාව්‍ය සාහිත්‍යය | 50 |
| 44 | 30. ඒකකය - සංස්කෘත මහාකාව්‍ය | 51 |
| 45 | 31. ඒකකය - සංස්කෘත ඛණ්ඩ කාව්‍යය | 53 |
| 46 | තක්සේරුව හා ඇගයීම - හැඳින්වීම | 54 |
| 47 | ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 57 |

# 12 ශ්‍රේණිය

# සංස්කෘත

## විෂය නිර්දේශය

## විෂය හැඳින්වීම

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘතභාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් බැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවෙකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම, කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමඟ ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දී, ගුජරාටී, මරාටී ආදි සියලු භාරතීය භාෂා භාවිත කරන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරැදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදා-ගැනීමට ප්‍රබල සටනක් ගෙන-ගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම්, ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමී ආදීන් ලෝ පතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් එබස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැයි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළ බසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර, එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැයි සම්මත විද්‍යානිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්. කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘත භාෂා අධ්‍යයනය අන් කිසිවකුටත් වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එබස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ව ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීමය

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

(I) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | |
|---|---|
| සාක්ෂරතාව | : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කරගැනීම |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| රූපක භාවිතය | : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය | : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම |

(II) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | |
|---|---|
| සමාජ පරිසරය | : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |
| ජෛව පරිසරය | : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුශලතා |
| භෞතික පරිසරය | : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ. |

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම, සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැනගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## සංස්කෘත භාෂාව- විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණ මාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙලඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යොතිර්විද්‍යාව වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුශලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැඟීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. හින්දු ස්තෝත්‍ර -හා බෞද්ධ ශ්ලෝක, සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇත. ඒවා මඟින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබාදීම

# සංස්කෘත විෂය

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 1.3, 1.4, 2.1, 2.2, 2.3, 2.4, 2,5, 2.6, 2.7, 2.8,2.9, 3.1, 3.2 | 100 |
| | II | 4.1, 4.2, 5.1, 5.2, 6.1, 6.2, 6.3, 6.4, 6.5, 7.1, 7.2 | 100 |
| | III | 8.1, 8.2, 9.1, 9.2, 10.1, 10.2, 10.3, 10.4, 10.5 | 100 |
| | | එකතුව | 300 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 වර්ණමාලාව නිවැරැදි ව හඳුනාගෙන ලියයි. | 1.1 මාධ්‍ය භාෂාවේ වර්ණමාලාව හා දේවනාගරී වර්ණමාලාව යන දෙකේ මූලික සම-විෂමතා හඳුනාගනියි.<br><br>1.2 දේවනාගරී අක්ෂර මාලාවේ ස්වර හා ව්‍යඤ්ජන ප්‍රභේද ලියා දක්වයි.<br><br>1.3 ව්‍යඤ්ජන හා ස්වර සංයෝගය, ස්වරාරෝපණය හා සංයුක්තාක්ෂර හඳුනාගනියි.<br><br>1.4 ව්‍යවහාරයේ ඇති සංස්කෘත වචන දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලියයි. | • මාධ්‍ය භාෂාවේ අක්ෂර මාලාව හා දේවනාගරී අක්ෂර මාලාව මාධ්‍ය භාෂාවේ අක්ෂර භාවිතයෙන්<br><br>• දේවනාගරී අක්ෂරමාලාව ලිවීම හා වර්ග කිරීම (ස්වරඃ හ්‍රස්ව, දීර්ඝ හා සන්ධ්‍යක්ෂර, ව්‍යඤ්ජනඃ වර්ගාක්ෂර අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර, අනුස්වාර, විසර්ග හා අනුනාසිකාක්ෂර, ඝෝෂ, අඝෝෂ, අල්පප්‍රාණ, මහාප්‍රාණ ආදිය)<br><br>• ව්‍යඤ්ජනාක්ෂර හා ස්වර සංයෝගය, ස්වරාරෝපණය (විවිධ පිළි භාවිතය) හා විවිධ සංයුක්තාක්ෂර<br><br>• නිතර භාවිත වන සංස්කෘත වචන දේවනාගරී අක්ෂරයෙන් ලිවීම | • මාධ්‍ය භාෂාවේ අක්ෂර මාලාව සමඟ දේවනාගරී අක්ෂර මාලාව හා වචන නිවැරැදි ව ලියයි; කියවයි; අසා ලියයි.<br><br>• මාධ්‍ය භාෂාවේ අක්ෂර මාලාව හා දේවනාගරී අක්ෂර මාලාව අතර ඇති සම-විෂමතා සංසන්දනාත්මක ව හඳුනාගෙන වගුගත කරයි.<br><br>• දේවනාගරී අක්ෂර මාලාවේ අක්ෂර ප්‍රභේද හඳුනාගෙන වර්ගීකරණය කර ලියා දක්වයි.<br><br>• දේවනාගරී අක්ෂර මාලාවේ ස්වරාරෝපණය (ව්‍යඤ්ජන හා ස්වර සංයෝගයේ දී ස්වර භාවිතය) පිළිබඳ පරිචය ලබාගෙන ලියා දක්වයි.<br><br>• සංයුක්තාක්ෂර හා සංයුක්තාක්ෂර ගොඩනැඟීමේ විධික්‍රම හඳුනාගෙන ලියා දක්වයි.<br><br>• මාධ්‍ය භාෂාවේ ඇති සංයුක්තාක්ෂර වචන දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලියයි.<br><br>• දේවනාගරී අක්ෂර සහිත වචන බලා ලියයි.<br><br>• දෛනික ව භාවිත වන සංස්කෘත වචන දේවනාගරී අක්ෂරයෙන් ලියයි.<br><br>• ව්‍යවහාරයේ ඇති සංස්කෘත වචන ලැයිස්තුගත කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2.0 භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි. | 2.1 පද වර්ග හඳුනාගනියි.<br><br>2.2 පද යෝජනය හඳුනාගනියි.<br><br>2.3 ලිංග, විභක්ති සහ කාරක හඳුනාගනියි.<br><br>2.4 සන්ධි වර්ග හඳුනාගෙන භාවිත කරයි.<br><br>2.5 ධාතු, ධාතුගණ හා ලකාර (සාර්වධාතුක) හඳුනාගනියි.<br><br>2.6 තද්ධිත හා කෘදන්ත හඳුනාගනියි; භාවිත කරයි.<br><br>2.7 සමාස හඳුනාගනියි; භාවිත කරයි.<br><br>2.8 ප්‍රත්‍යාර්ථ ක්‍රියා හඳුනාගනියි; භාවිත කරයි.<br><br>2.9 අව්‍ය පද හඳුනාගනියි; භාවිත කරයි. | • නාමපද (නාම විශේෂණ ඇතුළත් ව), ක්‍රියාපද (ක්‍රියා විශේෂණ ඇතුළත් ව), අව්‍ය පද (නිපාත සහ උපසර්ග) වර්ගීකරණ<br><br>• ලිඞ්ග භේදය, විභක්ති හා කාරක<br><br>• බාහිර, අභ්‍යන්තර සන්ධි හා ස්වර, ව්‍යඤ්ජන, විසර්ග සන්ධි ප්‍රභේද<br><br>• සන්ධි විශ්ලේෂණය හා සංස්ලේෂණය<br><br>• සන්ධි කාර්ය හා සන්ධි ප්‍රයෝජන<br><br>• ධාතුවල විවිධතා හා ධාතුගණ 1,4, 6,10 හා සාර්වධාතුක ලකාර<br><br>• තද්ධිත හා කෘදන්ත හඳුන්වාදීම<br><br>• සමාස පිළිබඳ මූලික දැනුමක් ලබාගෙන භාවිත කිරීම<br><br>• ප්‍රත්‍යාර්ථ ක්‍රියා හඳුන්වා දීම<br><br>• විවිධ අව්‍ය පද (තුමන්ත හා පූර්වක්‍රියා ඇතුළු ව) | • නාම, ක්‍රියා, අව්‍ය (නිපාත හා උපසර්ග) ලෙස පදවල ප්‍රධාන කොටස් වර්ගීකරණය කරයි.<br>• නාම පද හා ක්‍රියාපද සමග උපසර්ග පද යොදා අර්ථවත් වන අයුරින් ගලපා සරළ වාක්‍ය නිර්මාණය කරයි.<br>• විභක්ති අනුව නාම පදයක විවිධ කාර්යයන් හඳුනාගෙන ලියා දක්වයි.<br>• සන්ධිකරණයෙන් හා විසන්ධිකරණයෙන් ලද පරිචය ඇසුරින් වාක්‍යවල සන්ධි පද හා විසන්ධි පද වෙන් කර දක්වයි.<br>• අනිවාර්ය සංශ්ලේෂණ හඳුනාගනියි; භාවිත කරයි; භාවිතයෙන් ලියයි.<br>• සාර්වධාතුක ගණයට අයත් 1-4-6-10 වරනැගීම්වල විශේෂතා හඳුනාගෙන ප්‍රකාශ කරයි; ආඛ්‍යාත පද භාවිත කරයි.<br>• තද්ධිත හා කෘදන්ත හඳුනාගෙන වර්ගීකරණය කර දක්වයි; වෙනස පෙන්වා දෙයි.<br>• සමාස වර්ග වෙන් වෙන් ව නම් කරයි; විශේෂතා දැන ප්‍රකාශ කරයි.<br>• ප්‍රත්‍යාර්ථ ක්‍රියා වර්ග වෙන් වෙන් ව නම් කරයි; භාවිත කරයි.<br>• දෙන ලද ඡේදයක උපසර්ග, නිපාත, පූර්වක්‍රියා, තුමන්තක්‍රියා වෙන් කර දක්වයි. | 63 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 3.0 කියවා අර්ථය අවබෝධ කරගනියි. | 3.1 සරල ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි.<br>3.2 සරල පද්‍ය පාඨ හා ගද්‍ය පද්‍ය මිශ්‍ර පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි. | • සරල ගද්‍ය-පද්‍ය පාඨ ඇතුළත් කෘතිවලින් තෝරාගත් කොටස් (බාලාදර්ශය ආදි පොත්)<br>• උපදේශ හා වීරකාව්‍ය සාහිත්‍යයෙන් තෝරාගත් පාඨ | • සංස්කෘත ගද්‍ය-පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර ලියයි.<br>• සංස්කෘත භාෂාවේ වචනවල අර්ථ මාධ්‍ය භාෂාවෙන් ලියයි.<br>• සරල ගද්‍ය, පද්‍ය පාඨ නිවැරැදි ව මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර ලියයි.<br>• සාහිත්‍ය රසාස්වාදන ශක්‍යතා වර්ධනය කරගෙන රසාස්වාදනයක යෙදෙයි. | 17 |
| 4.0 සාහිත්‍ය රසාස්වාදනයේ යෙදෙයි. | 4.1 සාහිත්‍යාත්මක නිර්මාණයක ලක්ෂණ හඳුනාගනියි.<br>4.2 සාහිත්‍යාත්මක පාඨයක රසය විඳගනියි; ප්‍රකාශ කරයි. | • සරල ගද්‍ය-පද්‍ය පාඨ ඇතුළත් කෘතිවලින් තෝරාගත් කොටස් (බාලාදර්ශය ආදි පොත්)<br>• උපදේශ හා වීරකාව්‍ය සාහිත්‍යයට අයත් කෘතිවලින් තෝරාගත් කොටස් | • ජීවිතය දෙස සෞන්දර්යාත්මක හා සංවේදී දෘෂ්ටියකින් බලා අදහස් ප්‍රකාශ කරයි.<br>• නිර්මාණයක් ආශ්‍රයයෙන් රස වින්දන හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• තමා ලද සාහිත්‍ය වින්දන හැකියාව අන්‍යයන් හා බෙදාගනියි.<br>• සංස්කෘත සාහිත්‍යයේ සමාජ උපයෝගීතාව පිළිබඳ රචනාවක් ලියයි. කථාවක් පවත්වයි. | 16 |
| 5.0 භාෂා සාහිත්‍යයේ අන්තර්ගත සාරධර්ම චරිතාබද්ධ කරයි; ප්‍රකාශ කරයි. | 5.1 පාඨයක අන්තර්ගත සාරධර්ම හඳුනාගනියි; චරිතාබද්ධ කරයි.<br>5.2 සාරධර්ම අගයයි; ප්‍රකාශ කරයි. | • සරල ගද්‍ය-පද්‍ය පාඨ ඇතුළත් කෘතිවලින් තෝරාගත් කොටස් (බාලාදර්ශය ආදි පොත්)<br>• උපදේශ හා වීරකාව්‍ය සාහිත්‍යයට අයත් කෘතිවලින් තෝරාගත් කොටස් | • ජීවිතයට අත්‍යවශ්‍ය සාරධර්ම අවබෝධ කොට ගෙන ජීවිතාරෝපණය කොට ප්‍රදර්ශනය කරයි.<br>• සමාජානුයෝජනයේ දී අදීන චරිත මිනුම් දණ්ඩක් ලෙස භාවිත කරයි.<br>• සාර්ථක චරිතයක අඩංගු ලක්ෂණ සංස්කෘත සාහිත්‍යය ඇසුරින් පෙළ ගස්වයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 6.0 නිරවුල් ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි. | 6.1 සරල ප්‍රශ්න අසයි.<br><br>6.2 ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.<br><br>6.3 සරල උපදෙස් ලබා දෙයි.<br><br>6.4 ශබ්ද නිවැරැදි ව උච්චාරණය කරයි.<br><br>6.5 සංවාදයේ යෙදෙයි. | • දෛනික සිදුවීම් පිළිබඳ ප්‍රශ්න ඇසීම<br><br>• දෛනික සිදුවීම් පිළිබඳ පිළිතුරු දීම<br><br>• ආචාර-සමාචාර පිළිබඳ උපදෙස්<br><br>• සුදුසු මාතෘකාවක් යටතේ කිහිප දෙනකු සම්බන්ධ වී සංවාදයක් ගොඩනැගීම | • දෛනික සිදුවීම් ඇසුරින් සංස්කෘතයෙන් කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සරල ප්‍රශ්න අසයි; පිළිතුරු දෙයි.<br><br>• දෛනික ජීවිතයේ විවිධ අවස්ථාවල දී ආචාර-සමාචාර දැක්වීමට ශිෂ්‍යයා සංස්කෘත භාෂා මාධ්‍යය භාවිත කරයි.<br><br>• නිරවද්‍ය උච්චාරණ ශක්‍යතාව ලබයි.<br><br>• ආත්ම විශ්වාසය ඇති ව සංස්කෘතයෙන් කථා කරයි. | 28 |
| 7.0 සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරැදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | 7.1 තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය හෝ පාඨවලට සවන් දී අර්ථ අවබෝධ කරගනියි.<br><br>7.2 තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය පාඨවලට සවන් දී නිවැරැදි ව ප්‍රතිචාර දක්වයි. | • නිවැරදි භාෂණයේ යෙදීම<br><br>• උපදේශ කථා, ප්‍රබන්ධ කථා සාහිත්‍යයට අයත් ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් | • නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨවලට සවන් දී සරල අවබෝධයක් ලබාගෙන ලියා දක්වයි; ප්‍රකාශ කරයි.<br><br>• සංස්කෘත පාඨවලට සවන් දී කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br><br>• සංස්කෘත පද්‍ය හා ගද්‍ය පාඨ සාමූහික ව හා කේවල ව සජ්ඣායනා කරයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 8.0 අදාළ සංස්කෘතික පරිසරය හඳුනාගනියි.<br><br>9.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය කරයි. | 8.1 ආගමික පරිසරය හඳුනාගනියි.<br><br>8.2 ආධ්‍යාපනික පසුබිම හඳුනාගනියි.<br><br>9.1 සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට නිවැරැදි අර්ථය ලැබෙන සේ පරිවර්තනය කරයි.<br><br>9.2 මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට ව්‍යාකරණානුකුල ව පරිවර්තනය කරයි. | • වීරකාව්‍ය හා උපනිෂත් සාහිත්‍ය පිළිබඳ සරල දැනුමක් ලබාදීම<br><br>• බාලාදර්ශ, සුරභාරතී, ප්‍රථමාදර්ශ, සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකය, සංස්කෘත පාඨමාලා යන ග්‍රන්ථවලින් උපුටාගත් කොටස්<br><br>• සංස්කෘත ශික්ෂකය i, සරල සංස්කෘත ශික්ෂකය i, සංස්කෘත ප්‍රථම ප්‍රස්තකය යන කෘති ඇසුරින් තෝරාගත් වාක්‍ය හා මාධ්‍ය භාෂාවෙන් නිර්මාණය කරගත් සරල වාක්‍ය සහිත ඡේද | • අදාළ සංස්කෘත සාහිත්‍ය කෘතිවලින් පිළිඹිඹු වන සමකාලීන ආගමික හා සංස්කෘතික පරිසරය හඳුනාගෙන කියයි; ලියයි.<br><br>• ආගමික ජීවිතය හා ස්වාභාවික පරිසරය පිළිබඳ ව කථාවක් පවත්වයි; ව්‍යාපෘතියක් හෝ නිබන්ධයක් හෝ සකස් කරයි.<br><br>• වීරකාව්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන ආධ්‍යාපනික සංකල්ප මතු කර ප්‍රකාශ කරයි.<br><br>• උපනිෂද් අධ්‍යාපනයෙහි ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br><br>• නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට ද මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට ද පරිවර්තනය කර ලියයි.<br><br>• ගුරුවරයා අසන ප්‍රශ්නවලට සරල අර්ථය හුවා දක්වමින් පිළිතුරු සපයයි. | 30<br><br>40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 10.0 සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවබෝධය ලබාගනියි. | 10.1 වෛදික සාහිත්‍යය පිළිබඳ ව සරල අවබෝධයක් ලබාගනියි.<br><br>10.2 වීරකාව්‍ය සාහිත්‍යය හඳුනාගනියි.<br><br>10.3 සංස්කෘත මහාකාව්‍ය ලක්ෂණ හඳුනාගනියි.<br><br>10.4 සංස්කෘත මහාකාව්‍ය හඳුනාගෙන විස්තර කරයි.<br><br>10.5 සංස්කෘත ඛණ්ඩකාව්‍ය හඳුනාගනියි. | • වේද සංහිතා, ආරණ්‍යක, උපනිෂද් හා පුරාණ ග්‍රන්ථ පිළිබඳ ව සරල දැනුමක්<br>• වීරකාව්‍ය කෘතිවල කර්තෘ, කාලය, අන්තර්ගතය හා සුවිශේෂතා<br>• පූර්ව-කාලිදාස යුගයේ හා පශ්චාත්-කාලිදාස යුගයේ මහාකාව්‍ය හා මහාකාව්‍ය ලක්ෂණ<br>• අශ්වඝෝෂ, කාලිදාස, භාරවී, භට්ටී, මාඝ, කුමාරදාස, ශ්‍රී හර්ෂ යන මහ කවීන්ගේ කෘති හා ඔවුන් ජීවත් වූ කාල වකවනු<br>• කාලිදාස හා ජයදේව යන කවීන්ගේ ඛණ්ඩකාව්‍ය | • වෛදික සාහිත්‍ය ග්‍රන්ථ නම් කරයි.<br>• වීරකාව්‍ය කෘතිවල සංඥා, නිමිත්ත, කර්තෘ, ප්‍රමාණ, ප්‍රයෝජන විස්තර කරයි.<br>• මහාකාව්‍ය ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• සංස්කෘත මහාකාව්‍ය නම් කරයි.<br>• සංස්කෘත ඛණ්ඩකාව්‍ය ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• ඛණ්ඩකාව්‍ය හා ඒවායේ කර්තෘවරුන් නම් කරයි. | 30 |

### 12 ශ්‍රේණිය

## නිර්දිෂ්ට ග්‍රන්ථ

01. සංස්කෘත ප්‍රවේශය - ගද්‍ය පද්‍යාවලී III සංස්කරණය - මහචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, ආචාර්ය කේ.බී. ජයර්ධන සහ ඒ.කේ.එච්. ධර්මප්‍රිය
02. සංස්කෘත අකුරු ලියමු (1) ග්‍රන්ථය (සංයුක්ත තැටි 2 සමග) ප්‍රාචී අධ්‍යාපන ආයතනය
03. සංස්කෘත ප්‍රවේශ පාඨමාලාව I - ප්‍රාචී අධ්‍යාපන ආයතනය.
04. සංස්කෘත බාලාදර්ශය - පළමු පාඩමේ සිට දහවැනි පාඩම තෙක් (1-10)
05. සංස්කෘත ප්‍රථමාදර්ශය - සවැනි පාඩමේ සිට දසවැනි පාඩම තෙක් (6-10)

## ආශ්‍රේය ග්‍රන්ථ

| | | |
|---|---|---|
| 01 සුරභාරතී | - | මහාචාර්ය ඩබ්.එස්. කරුණාතිලක |
| 02 සංස්කෘත ශික්ෂකය ප්‍රථම හා ද්විතීය පුස්තක | - | මහාචාර්ය එම්.එච්.එෆ්. ජයසූරිය |
| 03 සංස්කෘත නාමාඛ්‍යාත විවරණය | - | මහාචාර්ය වරාගොඩ පේමරතන හිමි |
| 04 සරල සංස්කෘත ශික්ෂකය 1, 11 | - | අතිපූජ්‍ය බළංගොඩ ආනන්දමෛත්‍රේය නාහිමි |
| 05 ආධුනික සංස්කෘත ව්‍යාකරණය | - | ඒ.ඒ. මැක්ඩොනල්ඩ් |
| 06 වෛදික සාහිත්‍යය | - | මහාචාර්ය ජයදේව තිලකසිරි |
| 07 සංස්කෘත කාව්‍ය සාහිත්‍යය | - | මහාචාර්ය ජයදේව තිලකසිරි |
| 08. සංස්කෘත නාට්‍ය සාහිත්‍යය | - | මහාචාර්ය ජයදේව තිලකසිරි |
| 09. සංස්කෘත ප්‍රථම පුස්තකය | - | ආර්. ජී. භාණ්ඩාර්කර් |
| 10. සංස්කෘත සාහිත්‍යය | - | ජී.එස්.බී. සේනානායක |

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් හා ආගමික භාෂාවක් වශයෙන් සංස්කෘත භාෂාව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මධ්‍යස්ථානවල පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම, භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාවගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත්වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නොකොට පාසල් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පාසල තුළ විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පාසල් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පාසලේ පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කරගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධාන ය විය යුතු ය.

01. සංස්කෘත භාෂා දින,
02. කණ්ඩායම් සංවාද,
03. මාසික වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, ගායනය,
04. කෙටි නාට්‍ය සැකසීම, ඉදිරිපත් කිරීම,
05. බිත්ති පුවත්පත් පළ කිරීම,
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම,
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම ආදි වැඩසටහන් ඒ සඳහා උදාහරණ වේ.

## තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගෙනුම් කාර්යයේ දී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලයන්ගේ ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම්ඵලවලට ළඟා වන ආකාරය හඳුනාගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කරගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩ පිළිවෙළ යනු ශිෂ්‍යයාගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කරගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන්ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ සංස්කෘත භාෂාව දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල්ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බව යි. සිංහල භාෂා-සාහිත්‍යය වෙත සුවිශාල ආභාසයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. "සර්වභාෂාසු යා ශ්‍රේෂ්ඨා " ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමුහයන්ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ මවුබස කොට ඇති ශිෂ්‍යයාට ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නොවූව ද විෂමතා හඳුනාගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලි විෂයයක් බවට පත් කිරීමටත් එම විෂය ඉගෙනීම සඳහා ඔවුන් පෙළඹවීමටත් භාෂාව පහසුවෙන් ඉගෙනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නොඉක්මවමින් පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකි ය. ඒ සඳහා තුලනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයන් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ඇත.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය, (Transmisson Role) ගනුදෙනු ක්‍රමය, (Transaction Role) ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුශලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role) මෙහි දී ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත්දායකයෙකුගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවෙන් අපේක්ෂා කෙරේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් උගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

සංස්කෘත විෂය, අ. පො. ස. (උ. පෙළ) සම්බන්ධයෙන් ගත් විට භාෂා විෂයයක් වන බැවින් භාෂාවන් ඉගෙනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදා ගත යුතු ය.

# 1. ඒකකය  සංස්කෘත වර්ණමාලාව හා එහි වර්ගීකරණය

**1.0 නිපුණතාව**

වර්ණමාලාව නිවැරැදි ව හඳුනාගෙන ලියයි.

**නිපුණතා මට්ටම**

1.1 මාධ්‍ය භාෂාවේ වර්ණමාලාව හා දේවනාගරී වර්ණමාලාව යන දෙකේ මූලික සම විෂමතා හඳුනාගෙන ලියයි.

1.2 දේවනාගරී වර්ණමාලාවේ ස්වර හා ව්‍යඤ්ජන ප්‍රභේද  වගුගත කරයි.

**කාලච්ඡේද**  12

**ඉගෙනුම් පල**

- මාධ්‍ය භාෂාවේ වර්ණමාලාව සමඟ දේවනාගරී වර්ණමාලාව සසඳමින් ලියයි.
- මාධ්‍ය භාෂාගත වර්ණමාලාවේ හා දේවනාගරී වර්ණමාලාවේ සම - විෂමතා පැහැදිලි කරයි.
- දේවනාගරී අක්ෂර පියවරින් පියවර ගොඩනැඟෙන අයුරු ලියා දක්වයි.
- සංස්කෘත වර්ණමාලාව දේවනාගරී අක්ෂර භාවිත කරමින් නිවැරැදි ව ලියා දක්වයි.
- සංස්කෘත වර්ණමාලාව ප්‍රභේද ගත කර වගුවකින් ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත භාෂාවට අනන්‍ය වූ වර්ණමාලාව වනුයේ දේවනාගරී වර්ණමාලාව යි. එම වර්ණමාලාව යම් යම් වෙනස්කම් සහිත ව හින්දී භාෂාව ලිවීමේ දී යොදා ගැනේ. එසේ ම පාලි බඳු ප්‍රාකෘත භාෂා ලිවීමේ දී ද එය භාවිත කෙරේ.

සාම්ප්‍රදායික සංස්කෘත වර්ණමාලාවට අයත් අක්ෂර 49කි. එහෙත් ඎ ස්වරය ව්‍යවහාරයේ නොයෙදෙන හෙයින් සංස්කෘත වර්ණමාලාව 48ක් සේ සැලකීම වඩා නිවැරැදි ය. සංස්කෘත වර්ණමාලාවේ ඇති සියලු අක්ෂර සිංහල වර්ණමාලාවට ඇතුළත් ය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන විට සම්මත ජාත්‍යන්තර ලකුණු [International standard diacritical marks] භාවිත කිරීම අවශ්‍ය වේ.

දේවනාගරී අක්ෂරයක් කොටස් 03කින් සමන්විත වේ. එනම්, අක්ෂරයේ මූලික ස්වරූපය, සිරස් ඉර, අවසාන තිරස් ඉර වශයෙනි. සංස්කෘත වර්ණමාලාව ස්වර හා ව්‍යඤ්ජන යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය. ස්වර 13කි. ඒවා හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර වශයෙන් ප්‍රභේද 03කි. ව්‍යඤ්ජනාක්ෂර 35කි. ඒවා වර්ගාක්ෂර, අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර, අනුස්වාර හා විසර්ග යනුවෙන් බෙදේ. වර්ගවල 1, 2 අකුරුත් පළමු ඌෂ්මාක්ෂර 03 ත් අඝෝෂ වේ. අනුස්වාරය හා විසර්ගය හැර අන් සියලු අකුරු ඝෝෂ වේ. වර්ගයන්හි අවසාන අක්ෂර අනුනාසික වේ. වර්ගයන්හි 1, 3 අකුරු අල්පප්‍රාණ වේ. වර්ගයන්හි 2, 4 අකුරු මහප්‍රාණ වේ.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- මාධ්‍ය භාෂාවේ වර්ණමාලාව පිළිවෙළින් ලිවීමට ශිෂ්‍යයාට උපදෙස් දෙන්න.
- දේවනාගරී වර්ණමාලාවේ ඒ ඒ අක්ෂර, මාධ්‍ය භාෂාවේ අදාළ අක්ෂර යටින් පිළිවෙළින් ලිවීමට සලස්වන්න.
- මාධ්‍ය භාෂාවේ වර්ණමාලාව වගු ගත කොට සංස්කෘත වර්ණමාලාව හා සම අකුරු එක් වර්ණයකින් ද සෙසු අකුරු වෙනත් වර්ණයකින් ද වර්ණ ගැන්වීමට උපදෙස් දෙන්න.

- දේවනාගරී අක්ෂර ලිවීමේ දී පහත සඳහන් පියවර ක්‍රමවේදය භාවිත කිරීමට සිසුන් හුරු කරවන්න.




- දේවනාගරී අක්ෂරවල රූප සාම්‍යතා හඳුනාගැනීමට ශිෂ්‍යයා යොමු කරන්න.

  **(अ / आ / ओ / औ - व / ब - म / भ – ध / घ / छ)**

- දේවනාගරී වර්ණමාලාවේ ස්වර හා ව්‍යඤ්ජන ප්‍රභේද ගත කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- මාධ්‍ය භාෂාවේ වර්ණමාලාව හා දේවනාගරී වර්ණමාලාව අතර සම - විෂමතා පැහැදිලි කරයි.
- දේවනාගරී අක්ෂර පියවරින් පියවර ගොඩනැගෙන අයුරු ලියා දක්වයි.
- දේවනාගරී වර්ණමාලාව ප්‍රභේද සහිත ව දක්වයි.
- ස්වර හා ව්‍යඤ්ජනාක්ෂර මිශ්‍ර කොට දෙන ලද අක්ෂර සමූහයක් අතරින් ස්වර ව්‍යඤ්ජන වෙන් කොට දක්වයි.
- දෙන ලද ඡේදයක ඇති අක්ෂර තෝරා වර්ග කොට ලියයි.
- ස්වරඃ හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර ආදි වශයෙන් ද, ව්‍යඤ්ජනඃ වර්ගාක්ෂර, අන්තඃස්ථාක්ෂර ආදි වශයෙන් ද වර්ග කොට ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- අක්ෂර පියවරින් පියවර ගොඩනැගෙන අයුරු දැක්වෙන පුවරුවක්
- සියලු ස්වර හා ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද සටහන් කළ පුවරුවක්
- අක්ෂර ප්‍රභේද සහිත දෘශ්‍ය සංයුක්ත තැටියක්

**වැඩිදුර ගවේෂණය**


- සංස්කෘත අකුරු ලියමු 1, ප්‍රාචී ප්‍රකාශන, කොළඹ, 2008.
- සංස්කෘත බාලාදර්ශ, ශාස්ත්‍රීඃ කේ.එල්.වී. ඵාල්සාට්, 2004.
- සරල සංස්කෘත ශික්ෂකය, පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ,: මොඩන් පොත් ප්‍රකාශකයෝ, නුගේගොඩ, 2014.
- සංස්කෘත ප්‍රථම පුස්තකය, ආර්.ජී. භාණ්ඩාර්කර්, (පරවාහැර පඤ්ඤානන්ද හිමි - පරිවර්තනය) කොළඹ, 1958.

## 2. ඒකකය පිලි හා සංයුක්තාක්ෂර භාවිතය

**1.0 නිපුණතාව**

වර්ණමාලාව නිවැරැදි ව හඳුනාගෙන ලියයි.

**නිපුණතා මට්ටම**

1.3 ව්‍යඤ්ජන හා ස්වර සංයෝගය, ස්වරාරෝපණය හා සංයුක්තාක්ෂර හඳුනාගනියි.

**කාලච්ඡේද 04**

**ඉගෙනුම් පල**

- ස්වරාරෝපණයේ (ව්‍යඤ්ජන හා ස්වර සංයෝගයේ) දී ස්වර චිහ්න භාවිතය පිළිබඳ පරිචය ලබාගනියි.
- මාධ්‍ය භාෂාගත වර්ණමාලාවේ පිලි භාවිතය හා සංස්කෘත වර්ණමාලාවේ පිලි භාවිතය තුලනාත්මක ව දක්වයි.
- සංයුක්තාක්ෂර හා සංයුක්තාක්ෂර ගොඩනැගීමේ විධික්‍රම හඳුනාගෙන ලියා දක්වයි.
- මාධ්‍ය භාෂාවේ ඇති සංයුක්තාක්ෂර සහිත වචන දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ස්වරාරෝපණයේ දී ඒ ඒ ස්වරයන්ට අදාළ ස්වර චිහ්න භාවිත වේ.

උදා: **क्** + **अ** = क

**क्** + **ऋ** = कृ

සංයුක්තාක්ෂර ගොඩනැගීමේ විධික්‍රම 02කි.

01. සංයෝග වන අකුරේ සිරස් ඉර ඉවත් කොට පසු අකුර සමඟ බද්ධ කොට ලිවීම.

**म्** + **य** = म्य

**क्** + **ऋ** + **त्** + **स्** + **न** = कृत्स्न

**प्** + **र** = प्र

**श्** + **व** = श्व

**ण्** + **ट** = ण्ट

02. සංයෝග වන අකුරට යටින් පසු අකුර ලිවීම.

**ङ्** + **क** = ङ्क

**प्** + **त** = प्त

**द्** + **द** = द्द

මීට අමතර ව ඇතැම් සංයුක්තාක්ෂර සඳහා විශේෂිත රූප භාවිත කෙරේ.

**क्** + **ष** = क्ष

ज्+ ञ = ज्ञ

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සිසුනට ව්‍යඤ්ජනාක්ෂර (හල් අකුරු) වෙන වෙන ම ලබා දී ස්වරාරෝපණය කිරීමට යොමු කරන්න.
- පිළිතුරු මාරු කොට සාකච්ඡාවට බඳුන් කරන්න.
- මාධ්‍ය භාෂාගත වර්ණමාලාවේ හා සංස්කෘත වර්ණමාලාවේ පිලි භාවිතය පිළිබඳ වෙනස සිසුන්ට පැහැදිලි කරන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා සංයුක්තාක්ෂර ගොඩනැඟීමේ විධික්‍රම යටතේ ඒවා ලිවීමට සලස්වන්න.
- කණ්ඩායම් දෙකෙහි ම තොරතුරු පදනම් කොටගෙන සංයුක්තාක්ෂර ගොඩනැඟීමේ පරිචය ලබාදෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ස්වරාරෝපිත වචන ඇතුළත් ඡේදයක එම වචනවල ස්වර ව්‍යඤ්ජන වෙන් කරයි.
- මාධ්‍ය භාෂාගත වර්ණමාලාවේ පිලි භාවිතය හා සංස්කෘත වර්ණමාලාවේ පිලි භාවිතයේ වෙනස්කම් ලියා දක්වයි.
- මාධ්‍ය භාෂාවෙන් ලියන ලද ස්වරාරෝපිත වචන ඇතුළත් ඡේදයක් දේවනාගරී අක්ෂරයෙන් ලියයි.

**වැඩි දුර ගවේෂණය**


- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල්,ඒ.ඒ.: අනුඃ ගුණපාල සේනාධීර, රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව, 1994.
- සංස්කෘත ශික්ෂකය 1,2, 3, පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.: නුගේගොඩ, 2002.
- සංස්කෘත බාලාදර්ශ, ශාස්ත්‍රීඃ කේ. එල්. වී. එාල්සාට්, 2004.
- සංස්කෘත අකුරු ලියමු 2, ප්‍රාචී ප්‍රකාශන, කොළඹ, 2008.

## 3. ඒකකය සංස්කෘත වචන භාවිතය

**1.0 නිපුණතාව**

වර්ණමාලාව නිවැරැදි ව හඳුනාගෙන ලියයි.

**නිපුණතා මට්ටම**

1.4: ව්‍යවහාරයේ ඇති සංස්කෘත වචන දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලියයි.

**කාලච්ඡේද 03**

**ඉගෙනුම් පල**

- දේවනාගරී අක්ෂර භාවිත කරමින් සරල සංස්කෘත වචන ලිවීමේ පරිචය ලබයි.
- දෛනික ව භාවිත වන මාධ්‍ය භාෂාගත සංස්කෘත වචන දේවනාගරී අක්ෂරයෙන් ලියා දක්වයි.
- ව්‍යවහාරයේ ඇති සංස්කෘත වචන ලැයිස්තු ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත වචන රාශියක් සිංහල භාෂක සමාජයේ එදිනෙදා භාවිත කෙරේ. ඉතිහාස, විද්‍යා, ආධාර, පෞද්ගලික, බාලිකා, උත්තම, ප්‍රවෘත්ති, අවමංගල්‍ය, ඖෂධ, නේවාසික, ඓශ්වර්ය, පුස්තකාලය, ගගන, චන්ද්‍ර, ඡායා, තරුණ, දිවා, ධන, නයන, පවිත්‍ර, ප්‍රතිඵල, කෘෂිකර්ම, මරණ, අවශ්‍ය, ශීතකරණ, භාෂා, ක්‍රීඩා, නාට්‍ය ආදිය උදාහරණ යි.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- මාධ්‍ය භාෂාවේ තෝරාගත් පාඨයක් හෝ ඡේදයක් හෝ ලබා දී එහි ඇති සංස්කෘත වචන හඳුනාගෙන උපුටා ලිවීමට යොමු කරන්න.
- එම උපුටාගත් වචන දේවනාගරී අක්ෂරයෙන් ලියවන්න.
- දෛනික ව භාවිත වන සංස්කෘත වචන දේවනාගරී අක්ෂරයෙන් ලියා දැක්වීමට යොමු කරන්න.
- තමා අවට පරිසරයේ නිතර භාවිත වන සංස්කෘත වචන ලැයිස්තුවක් පිළියෙළ කිරීමට උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- විෂයාන්තර පාඨ ග්‍රන්ථයක (විද්‍යාව, ත්‍රිපිටක ධර්මය, ඉතිහාසය වැනි) පාඩමකින් සංස්කෘත වචන තෝරා ලියයි.
- සංඥා නාම දේවනාගරී අකුරින් ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- මාධ්‍ය භාෂාවේ ප්‍රත්‍යය ගත වූ සංස්කෘත වචන සහිත පුවරුවක් (සංස්කෘත මූලයට හා මාධ්‍ය භාෂාවේ ප්‍රත්‍යයයට වෙන වෙන ම වර්ණ භාවිත කරන ලද).

**වැඩි දුර ගවේෂණය**


- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල් ඒ. ඒ.:අනු: ගුණපාල සේනාධීර, රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව, 1994.
- සංස්කෘත ශික්ෂකය 1, පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.: නුගේගොඩ, 2002.
- සංස්කෘත අකුරු ලියමු 3, ප්‍රාචී ප්‍රකාශන, කොළඹ, 2008.

# 4. ඒකකය පද වර්ග

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.1 පද වර්ග හඳුනාගනියි.

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- නාම, ක්‍රියා, අව්‍යය (නිපාත හා උපසර්ග) ලෙස පදවල ප්‍රධාන කොටස් වර්ගීකරණය කරයි.
- දෙන ලද වචන සමූහයක් ඒ ඒ පද යටතේ වර්ග කර දැක්වීමේ හැකියාව ලබයි.
- සරල ගද්‍ය කොටසක නාම හා ආඛ්‍යාත උපුටා ලියයි.
- පාඨ්‍ය ග්‍රන්ථයක් ඇසුරින් උපසර්ග සහිත වචන හා නිපාත උපුටා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

භාෂාවන්හි යෙදෙන පද වර්ග විවිධ වන අතර සංස්කෘත භාෂාවේ මූලික පද වර්ග 04කි. එනම් නාම, ක්‍රියා, නිපාත, උපසර්ග වශයෙනි. ඒ ඒ පදවලින් කෙරෙන කාර්යය විවිධ ය.

**නාම**

- නාම
  - නාමනාම -නර, මාතෘ, ශුනක
  - ස්ථාන නාම -නගර, කූප වන
  - ද්‍රව්‍ය නාම -පුෂ්ප, පුස්තක, ආසන
- සර්වනාම → සර්ව, තද්, අස්මද්, යුෂ්මද්
- විශේෂණ → රමණීය, සුන්දර, විශාල, දීර්ඝ
- සමාස → රාජපුත්‍ර, සමුද්‍රජල, වනවාස, ගුරුදක්ෂිණා
- තද්ධිත → නාවික, නාගරික, භෞමික, පෞරුෂ
- කෘදන්ත → ගච්ඡත්, මෘත, පතිත, ගන්තව්‍ය

**ක්‍රියා**

- ආඛ්‍යාත → ගච්ඡති, වදති, හසති
- පූර්වක්‍රියා → කෘත්වා, ප්‍රවිශ්‍ය, ගත්වා
- තුමන්ත ක්‍රියා → ගන්තුම්, ශ්‍රෝතුම්, වක්තුම්

**නිපාත** ඃ- වර නොනැගෙන, ස්වාධීන ව පවතින පද නිපාත වේ. (නි+පත් ධාතුව)

උදා ඃ- විනා, සාර්ධම්, අපි, ඛලු, ච, අලම්, පන, ඒවම්, යදි, චේත්,

**උපසර්ග** ඃ- වර නොනැගෙයි. නාම පද හා ක්‍රියා පදවල මුලට පමණක් යෙදෙයි. අර්ථයේ වෙනසක් ඇති කරයි. ස්වාධීන ව නොපවතියි. ගණනින් 20කි.

- උප+සෘජ් ධාතුවෙන් නිපන්නකි. ප්‍ර, පරා, අප, සම්, අනු, අව, නිස් (නිර්), දුස් (දුර්) වි, ආ (ඞ්), නි, අධි, අපි, අති, සු, උත්, අභි, ප්‍රති, පරි, උප.
- අන්තර්, ආවිර් ද උපසර්ග ලෙස සලකනු ලැබේ.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- පද වර්ගීකරණය කළ රුක් සටහනක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඒ පදවලින් වෙන් වෙන් වූ කාර්යයන් සිදුවන බව අවබෝධ කරවන්න.
- නාම, ක්‍රියා, නිපාත, උපසර්ග සඳහා සුදුසු පරිදි රුක් සටහන් සකසා සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- මිශ්‍ර සංස්කෘත වචන මාලාවක් හෙවත් පද සමූහයක් දී ඒවා නාම, ක්‍රියා, නිපාත, උපසර්ග වශයෙන් වගුගත කොට ලියන ලෙස උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘත පද වර්ග 04 නම් කරයි.
- දෙන ලද වචන සමූහයක් ඒ ඒ පද යටතේ වර්ග කරයි.
- සරල ගද්‍ය කොටසක නාම හා ආඛ්‍යාත උපුටා ලියයි.
- පාඨ්‍ය ග්‍රන්ථයක් ඇසුරින් උපසර්ග සහිත වචන හා නිපාත උපුටා ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- පද වර්ගීකරණය කළ පුවරුවක් (රුක් සටහනක්)
- නාම, ක්‍රියා ආදිය ප්‍රභේදගත කළ රුක් සටහන් පුවරු
- නිපාත, උපසර්ග සහිත වචන ඇතුළත් සරල ගද්‍ය කොටසක පිටපතක්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත ශික්‍ෂකය 3, පූජ්‍ය ආනන්දමෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.: නුගේගොඩ, 1964.
- සංස්කෘත ව්‍යාකරණ තරංගණී, (සංඥා - සන්ධි - නාම) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.: සමයවර්ධන, 1999.
- සංස්කෘත ප්‍රථම පුස්තකය, භාණ්ඩාර්කර්, ආර්, ජී.: කොළඹ, 1958.

# 5. ඒකකය පද යෝජනය

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.2 පද යෝජනය හඳුනාගනියි.

**කාලච්ඡේද** 02

**ඉගෙනුම් පල**

- නාම පද හා ක්‍රියා පද සමඟ උපසර්ග පද යොදා අර්ථවත් වන අයුරින් ගළපා සරල වාක්‍ය නිර්මාණය කරයි.
- විශේෂණ පදවල හා විශේෂ්‍ය පදවල වෙනස ලියා දක්වයි.
- නාම හා ක්‍රියා පදවලට විශේෂණ නිවැරැදි ව එකතු කර ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යම් පදයක් අනික් පදවලට වඩා වෙනසකින් දක්වන්නට අවශ්‍ය වූ විට භාවිත කෙරෙන්නේ විශේෂණ ය. එම විශේෂණයට ලක් වන පදය විශේෂ්‍ය යි. එම විශේෂණ, විශේෂ්‍ය පද දෙක ම ලිංග, විභක්ති, වචන වශයෙන් සමාන විය යුතු ය.

උදා ඃ- විශාලඃ පර්වතඃ
විශාලා ශාලා
විශාලම් ශකටම්

ආඛ්‍යාතයට මුලින් යොදන ක්‍රියා විශේෂණය, ද්විතීයා හෝ තෘතීයා හෝ විභක්ති පදයක් විය යුතු ය.

උදා ඃ- ජීවති → සුඛං ජීවති → සුඛේන ජීවති

මුලින් යෙදුණු උපසර්ගය නිසා නාම පදවල හා ක්‍රියා පදවල අර්ථය කිසියම් වෙනසකට ලක් වේ.

උදා ඃ-

අර්ථයට බාධා කරයි → භය → නිර්භය / ගච්ඡති → ආගච්ඡති
අර්ථය අනුව පවතියි → රූප → අනුරූප / වසති → නිවසති
අර්ථය බබුළුවයි → විනීත → සුවිනීත / වදති → සංවදති

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- නාම පද හා ක්‍රියා පද ලැයිස්තුවක් සිසුන්ට ලබාදෙන්න.
- එහි උපසර්ග එකතු කළ හැකි නාම හා ක්‍රියා පදවලට උපසර්ග එකතු කොට අර්ථවත් පද නිර්මාණය කරගැනීමට සහාය වන්න.
- එම උපසර්ග එකතු කරගත් නාම හා ක්‍රියා පද ගළපමින් අර්ථවත් සරල වාක්‍ය සැකසීමට උනන්දු කරවන්න.
- මිශ්‍ර කළ විශේෂණ හා විශේෂ්‍ය වචන මාලාවක් ලබා දී ඒවා අර්ථවත් ව ගැළපීමට යොමු කරන්න.
- ක්‍රියා විශේෂණ හා ක්‍රියා පද කීපයක් දී ඒවා අර්ථයක් එන සේ ගළපා ලිවීමට යොමු කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- උපසර්ගයක් නාම හා ක්‍රියා පදවල මුලින් යෙදෙන බව ප්‍රකාශ කරයි.
- උපසර්ග සමග ගළපා විවිධාර්ථ ප්‍රකාශ වන පද කියයි.
- නාම හා ක්‍රියා පදවලට උපසර්ග එකතු කරයි.

- නාම හා ක්‍රියා පදවලට විශේෂණ නිවැරැදි ව එකතු කරයි.
- උපසර්ග සහිත සරල වාක්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නාම පද හා ක්‍රියා පද ලැයිස්තුව
- මිශ්‍ර කළ විශේෂණ විශේෂ්‍ය වචන මාලාව ඇති සටහන
- ක්‍රියා විශේෂණ, විශේෂ්‍ය වචන මාලාව ඇති සටහන
- ක්‍රියා විශේෂණ හා ක්‍රියා පද වෙන වෙන ම ලියා ඇති ලේඛනයක්

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත ශික්‍ෂකය 3, පූජ්‍ය ආනන්දමෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ. නුගේගොඩ, 1964.
- සංස්කෘත ව්‍යාකරණ තරංගණී, (සංඥා - සන්ධි - නාම) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.: සමයවර්ධන, 1999.
- සංස්කෘත ප්‍රථම පුස්තකය, භාණ්ඩාර්කර්, ආර්, ජී.: කොළඹ, 1958.
- නාමාඛ්‍යාත පදමාලා, පූජ්‍ය පේමරතන හිමි, වරාගොඩ.: සමයවර්ධන, 1995.

## 6. ඒකකය ලිඞ්ග, විභක්ති හා කාරක

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.3 ලිඞ්ග, විභක්ති සහ කාරක හඳුනාගනියි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- ලිඞ්ගත්‍රයය, වචනත්‍රයය හා පුරුෂත්‍රයය නම් කර ලියයි.
- භාෂාවේ ලිංගභේදය පැහැදිලි කිරීමේ හැකියාව ලබයි.
- විභක්ති අනුව නාම පදයක විවිධ අර්ථයන් හඳුනාගෙන ලියා දක්වයි.
- විභක්තිගත වචනයක ශබ්දය, විභක්තිය, වචනය හා අර්ථය වගුවක ස්වරූපයෙන් ලිවීමේ හැකියාව ලබයි.
- විභක්ති හතෙහි වරනඟන ලද ශබ්දයක අර්ථ ලියා දක්වයි.
- සරල වාක්‍ය කිහිපයකින් කාරකාර්ථ මතු කර පෙන්වයි.
- කාරකාර්ථ සහිත සරල වාක්‍ය කිහිපයක් මාධ්‍ය භාෂාවෙන් සංස්කෘතයටත්, සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් පරිවර්තනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

පුරුෂ, ස්ත්‍රී, නපුංසක යනුවෙන් ලිඞ්ගත්‍රයයකි. ඒක, ද්වි, බහු වශයෙන් වචනත්‍රයයකි. ප්‍රථම, මධ්‍යම, උත්තම යැයි පුරුෂත්‍රයයකි. නාම වරනැඟෙන්නේ නාම විභක්තිවල ය. ඒවා 07කි. ප්‍රථමා, ද්විතීයා, තෘතීයා, චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී යනුවෙනි. ආලපනය ප්‍රථමාවේ ම අනුකොටසකි.

ක්‍රියා නිෂ්පත්තියට හේතු වන්නෝ කාරකයෝ ය. (ක්‍රියා සිද්ධ්‍යුපකාරකං කාරකම්) ක්‍රියා සිද්ධියට ඒ ඒ විභක්තිවල යෙදෙන පද යම් කිසි හෝ බලපෑමක් කරන්නේ නම් ඒවා කාරක වේ. එහෙයින් ආඛ්‍යාතයක් හා නොබැඳෙන ආලපන හා ෂෂ්ඨී විභක්ති කාරක යටතට නොගැනේ.

| **විභක්ති** | | **කාරක** |
|---|---|---|
| 1. ප්‍රථමා | ⟶ | 1. (උක්ත) කර්තෘ |
| 2. ද්විතීයා | ⟶ | 2. (අනුක්ත) කර්ම |
| 3. තෘතීයා | ⟶ | 3. කරණ /අනුක්ත කර්තෘ |
| 4. චතුර්ථී | ⟶ | 4. සම්ප්‍රදාන |
| 5. පඤ්චමී | ⟶ | 5. අපාදාන |
| 6. ෂෂ්ඨී | ⟶ | - |
| 7. සප්තමී | ⟶ | 6. අධිකරණ |

ෂෂ්ඨී විභක්ත්‍යර්ථය ක්‍රියා නිෂ්පාදනයට හේතු නොවන බැවින් ෂෂ්ඨීය කාරක නොවේ.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ලිඞ්ගත්‍රයය බෙදෙන අයුරු දැක්වෙන පුවරුව (රුක් සටහන) සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ලිඞ්ගත්‍රයයට අයත් නාම මාලාවක් ලබා දී කුමන ලිඞ්ගයට අයත් දැයි එක් එක් සිසුන්ගෙන් අහඹු ලෙස ප්‍රශ්න කොට ලබා දුන් පිළිතුරුවල නිරවද්‍යතාව තහවුරු කර ලිඞ්ගත්‍රයයට අයත් වචන ලැයිස්තුවක් සකස් කරන ලෙස උපදෙස් දෙන්න.
- සංස්කෘතයේ ලිංග භේදය භාවිතයෙන් උගත යුතු බව පහදා දෙන්න.

- ඒක, ද්වි, බහු වශයෙන් නාම පද වචන තුනකට වර්ග වන බව පහදා දෙමින් සිංහල භාෂාවේ වචනද්වයයක් ඇති මුත් සංස්කෘතයේ වචනත්‍රයයක් ඇති බව තහවුරු කරන්න.
- නාම කීහිපයක් වචනත්‍රයයෙහි වරනඟා පෙන්වන්න. (නර, ඵල, වනිතා, ගජ, පුෂ්ප, කාන්තා වැනි නාම)
- එක් එක් විභක්තිවල කාර්යයන් විවිධ බව වටහා දෙන්න.
- අදහස නිවැරැදි ව ප්‍රකාශ වීමට නාමය විභක්තිගත කළ යුතු බව අවබෝධ කරවන්න.
- නර ශබ්දය වරනඟා විවිධ අර්ථයන්හි යෙදෙන අයුරු පෙන්වා දෙන්න.
- පෙර සූදානම් කරගත් වාක්‍ය කීහිපයක් ඇසුරින් කාරකාර්ථ ප්‍රකාශ වන අයුරු පැහැදිලි කරන්න.
- කාරකාර්ථය ප්‍රකාශ වන වචනයේ හා ක්‍රියාපදයේ අන්තර් සම්බන්ධය කෙබඳු දැයි සිසුන්ගෙන් විමසන්න.
- ක්‍රියාපදය හා සම්බන්ධ වූ, ක්‍රියා සිද්ධියට උපකාර වූ විභක්තිගත පදය කාරක බව තහවුරු කරන්න.
- සරල වාක්‍ය කිහිපයකින් විභක්ති හා කාරක අතර වෙනස පහදා දෙන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ලිඞ්ගත්‍රයය, වචනත්‍රයය හා පුරුෂත්‍රයය නම් කරයි.
- නාම කීපයක ලිඞ්ගය කුමක් දැයි නිවැරැදි ව ප්‍රකාශ කරයි.
- නාම පද ඒක, ද්වි, බහු වශයෙන් වචනත්‍රයයට බෙදා දක්වයි.
- විභක්තිගත වචන 10ක ශබ්දය, විභක්තිය, වචනය හා අර්ථය වගුවක ස්වරූපයෙන් ලියා දක්වයි.
- විභක්තිගත කළ නර ශබ්දයේ අර්ථ ලියා දක්වයි.
- සරල වාක්‍ය කිහිපයකින් කාරකාර්ථ මතු කරගනියි.
- කාරකාර්ථ මතු කරමින් සරල වාක්‍ය කිහිපයක් ලියයි.
- කාරකාර්ථ මතු කරන සරල වාක්‍ය කිහිපයක් මාධ්‍ය භාෂාවෙන් සංස්කෘතයටත්, සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් හරවා ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- ලිඞ්ගත්‍රයය දැක්වෙන රුක් සටහන
- වරනඟන ලද නර ශබ්දය සහිත පුවරුවක්
- කාරකාර්ථය මතු වන වාක්‍ය ඇතුළත් පත්‍රිකාවක්
- විභක්ති හා කාරක වෙන වෙන ම දැක්වෙන සටහනක්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත ව්‍යාකරණ තරංගණී, (සංඥා - සන්ධි - නාම තරංග) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.: සමයවර්ධන, 1999.
- නාමාඛ්‍යාත පදමාලා, පූජ්‍ය පේමරතන හිමි, වරාගොඩ.: සමයවර්ධන, 1995.
- සංස්කෘත ප්‍රථමාදර්ශ, ශාස්ත්‍රී, කේ. එල්. වී.: එල්සාට්, 2001.

## 7. ඒකකය සන්ධි ප්‍රභේද

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.4 සන්ධි වර්ග හඳුනාගෙන භාවිත කරයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- සන්ධි යනු කුමක් දැයි සරල ව හඳුනාගෙන භාවිත කරයි.
- සන්ධි කාර්ය හා සන්ධි ප්‍රභේද යන වචන දෙකෙහි වෙනස පැහැදිලි කරයි.
- සන්ධි ප්‍රභේද වශයෙන් වර්ග කරයි.
- සන්ධි කාර්යය ලියා දක්වයි.
- විවිධ සන්ධි පද විසන්ධි කර විසන්ධි පද සන්ධි කර කියයි, ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සන්ධි යනු එකතු වීමකි. මාර්ග හා ශරීර අස්ථි එකතු වන තැන් ද සන්ධි (හන්දි) ලෙස හැඳින්වේ. වෙන් ව ඇති පද හෝ ප්‍රත්‍යය හෝ එකතුවීම් වශයෙන් ද භාෂා භාවිතයේ දී ද සන්ධි වීම් හමුවේ. භාෂාවේ සන්ධි භාවිත වන්නේ සුඛෝච්චාරණය සඳහා ය. ඒවා බාහිර හා අභ්‍යන්තර යැයි වර්ග දෙකකට බෙදේ. වචන දෙකක් එකතු වීම බාහිර සන්ධි නම් වේ.

| | | | | |
|---|---|---|---|---|
| චිර | + | ආගත | = | චිරාගත |
| මහා | + | ඊශ්වර | = | මහේශ්වර |
| චන්ද්‍ර | + | උදය | = | චන්ද්‍රෝදය |
| අග්නිඃ | + | අත්‍ර | = | අග්නිරත්‍ර |

එක ම පදයක් තුළ ශබ්දයකට හෝ ධාතුවකට හෝ ප්‍රත්‍යය එකතු වීමේ දී සිදු වන ක්‍රියාවලිය අභ්‍යන්තර සන්ධි නම් වේ.

| | | | | |
|---|---|---|---|---|
| එල | + | ඉ | = | එලේ |
| වාච් | + | සු | = | වාක්ෂු |
| අද් | + | ති | = | අත්ති |
| විට් | + | භ්‍යාම් | = | විඩ්භ්‍යාම් |

ස්වර, ව්‍යඤ්ජන, අනුස්වාර, විසර්ග හා ප්‍රකෘතිභාව වශයෙන් සන්ධි ප්‍රභේද 05කි. ස්වර, ව්‍යඤ්ජන, අනුස්වාර, විසර්ග යන අක්ෂර හා සම්බන්ධ ව සන්ධි කාර්යය වන බැවින් ඒ නමින් හඳුන්වනු ලබන අතර වෙනසකට පත් නොවන නිසා ප්‍රකෘතිභාව නම්.

දීර්ඝ, ගුණ, වෘද්ධි, ව්‍යස්ත, ලෝප, ලෝපශ්, ආදේශ, ආගම වශයෙන් සන්ධි කාර්යයෝ වෙති. භාෂාවේ සන්ධි පද නිරායාසයෙන් හමු වේ. එමෙන් ම වචන, පද උච්චාරණයේ දී ඒවා සන්ධි වී උච්චාරණය වීම ආයාසයෙන් කළ යුතු දෙයක් නොව වාග් විද්‍යානුකූල ව නිරායාසයෙන් සිදු වන්නකි. ඇතැම් පද ස්වර විපර්යාසයෙන් ද, ඇතැම් ඒවා ව්‍යඤ්ජන විපර්යාසයෙන් ද, ඇතැම් ඒවා අනුස්වාරය හා විසර්ගය විපර්යාසයෙන් ද සිදු වේ. ඇතැම් විට විපර්යාසයකට පත් නොවන අවස්ථා ද වේ.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සන්ධි යනු කුමක් දැයි පැහැදිලි කළ හැකි ප්‍රායෝගික උදාහරණයක් ඇසුරින් පාඩමට ප්‍රවේශ වන්න.
- භාෂාවේ සන්ධි බාහිර, අභ්‍යන්තර වශයෙන් ද ස්වර, ව්‍යඤ්ජන, අනුස්වාර, විසර්ග හා ප්‍රකෘතිභාව වශයෙන් ද ප්‍රභේද ඇති බව පැහැදිලි කරන්න.
- එසේ සන්ධි වනුයේ ලෝප, ආදේශ ආදි කාර්යයන්ගෙන් බව විස්තර කර දෙන්න.

- දෙනු ලබන ඡේදයක් ඇසුරින් සන්ධි පද කිහිපයක් උපුටා ලියවන්න.
- එම සන්ධි පද විසන්ධි කරන ලෙස උපදෙස් දෙන්න.
- සන්ධි වීමේ දී අක්ෂර අතර ඇති වන වෙනස්කම් තේරුම් ගැනීමට සහාය වන්න.
- සන්ධි පද සහිත කෙටි වාක්‍ය කීපයක් ලියවන්න.
- සන්ධි වීමෙන් ඇති වන ප්‍රයෝජන පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සන්ධි ප්‍රභේද වර්ගීකරණය කරයි.
- සන්ධි කාර්යයන් ලියා දක්වයි: ප්‍රකාශ කරයි.
- විවිධ සන්ධි පද විසන්ධි කරයි.
- විවිධ විසන්ධි පද සන්ධි කරයි.
- සන්ධි පද කෙටි වාක්‍යවල ඇතුළත් කරයි.
- සන්ධි ප්‍රයෝජන මොනවා දැයි විස්තර කරයි.

**වැඩිදුර ගවේෂණය**


- සංස්කෘත ව්‍යාකරණ තරංගණී, (සංඥා - සන්ධි - නාම තරංග) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.: සමයවර්ධන, 1999.

- ආධුනික සංස්කෘත ව්‍යාකරණය. මැක්ඩොනල්, ඒ. ඒ.: අනු: ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1964.

# 8. ඒකකය ධාතු ගණ හා ලකාර

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.5 ධාතු, ධාතුගණ හා ලකාර (සාර්ව ධාතුක) හඳුනාගනියි.

**කාලච්ඡේද** 14

**ඉගෙනුම් පල**

- ධාතු ගණ 10 නිවැරදි ව මතකයෙන් කීමේ හැකියාව ලබයි.
- ධාතු ගණවල පළමු වරනැඟීම හා දෙවැනි වරනැඟීම වශයෙන් ප්‍රභේද දෙකක් ඇති බව ප්‍රකාශ කරයි.
- 1, 4, 6, 10 යන ප්‍රථම වරනැඟීමට අයත් ධාතු ගණවල විශේෂතා හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ධාතුවත් ප්‍රත්‍යයත් අතර යෙදෙන විකරණය නම් වූ ප්‍රත්‍යය හඳුනාගනියි.
- ධාතුවලට විකරණ එකතු කොට ධාත්වංග ලියා දක්වයි.
- මිශ්‍ර කළ ක්‍රියා පද ඒ ඒ ධාතු ගණ යටතේ පෙළ ගස්වා ලියයි.
- ලකාර 10 (දහය) නිවැරදි ව මතකයෙන් කීමේ හැකියාව ලබයි.
- සාර්වධාතුක හා ආර්ධධාතුක යන වචනවල අර්ථ ප්‍රකාශ කරයි.
- සාර්වධාතුක හා ආර්ධධාතුක ලකාර නිවැරදි ව නම් කරයි.
- ඒ ඒ ලකාරවල ප්‍රත්‍යයන් තාලානුරූපී ව උච්චාරණය කරයි.
- ධාතු කිහිපයක් සාර්වධාතුක ලකාරවල වරනඟයි.
- පාඨ්‍ය ග්‍රන්ථයක් ඇසුරින් සාර්වධාතුක ලකාර පද උපුටා වගුගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත භාෂාව ධාතු මූලික භාෂාවක් වන අතර එහි සියලු ධාතු වරනැඟෙන ස්වභාවය අනුව ගණ 10කට බෙදා දක්වා ඇත. ඒ ඒ ගණයන්ට අයත් විකරණ ප්‍රත්‍යය මෙසේ ගණ වශයෙන් බෙදීමට මූලික හේතුව යි. ධාතුවටත් ලකාර ප්‍රත්‍යයටත් අතර යෙදෙන ප්‍රත්‍යය විකරණය නම් වේ.
1, 4, 6, 10 යන ගණ පළමු වරනැඟීම ලෙසත් සෙසු ඒවා දෙවැනි වරනැඟීම ලෙසත් නම් කෙරේ. පළමු වර්ගයේ ධාත්වංගය අකාරාන්ත ව සිටීමත්, දෙවැනි වර්ගයේ ධාත්වංගය ප්‍රබල දුබල වශයෙන් සිටීමත් පළමු වර්ගයේ හා දෙවැනි වර්ගයේ වරනැඟීම් ලෙස වර්ග කරන්නට හේතු වී ඇත.

1 **ගණය** ඃ- " අ " විකරණය යෙදේ. ධාතුවේ අන්ත්‍ය ස්වරය හෝ හ්‍රස්ව උපධා ස්වරය හෝ " අ " හැර වෙනත් හ්‍රස්ව ස්වරයක් නම් ගුණ වේ.

| | | |
|---|---|---|
| ✓භූ + අ + ති<br>හෝ + අ + ති<br>භව් + අ + ති<br>භවති | ✓තෘ + අ +ති<br>තර් + අ + ති<br>තරති | ✓බුධ් + අ + ති<br>බෝධ් + අ + ති<br>බෝධති |

★ ධාතු මැද " අ " හෝ දීර්ඝ ස්වරයක් හෝ ඇති විටත් " අ " හැර වෙනත් ස්වරයක් තිබුණ ද පර ව සංයුක්තාක්ෂරයක් වේ නම් ගුණ නොවේ.

✓ජල්ප් ⟶ ජල්පති / ✓ක්‍රීඩ් ⟶ ක්‍රීඩති / ✓නම් ⟶ නමති
✓නින්ද් ⟶ නින්දති / ✓ශික්ෂ් ⟶ ශික්ෂති

**4 ගණය** ඃ- "ය " විකරණය යෙදේ.

✓තුෂ් + ය + ති > තුෂ්‍යති
✓අස් + ය + ති > අස්‍යති
✓කුප් + ය + ති > කුප්‍යති

★ ඇතැම් විට ධාතුවේ ස්වරය දීර්ඝ වේ.

✓දිව් + ය + ති > දීව්‍යති
✓මද් + ය + ති > මාද්‍යති
✓භ්‍රම් +ය + ති > භ්‍රාම්‍යති

**6 ගණය** ඃ- "අ " විකරණය යෙදේ.

✓තුද් + අ + ති > තුදති
✓විශ් + අ + ති > විශති

★ ඇතැම් ධාතු ''අ'' විකරණය ගැනීමේ දී වෙනස් වේ.

✓ඉෂ් + අ + ති > ඉඡ් + අ + ති > ඉච්ඡ් + අ + ති > ඉච්ඡති.
✓ඍ + අ + ති > ඍඡ් + අ + ති > ඍච්ඡ් + අ + ති > ඍච්ඡති.
✓ගෲ + අ + ති > ගිර් + අ + ති > ගිරති

★ ඇතැම් ධාතු සම්ප්‍රසාරණය වේ.

✓භ්‍රජ්ජ් + අ + ති > භෘජ්ජති
✓ප්‍රච්ඡ් + අ + ති > පෘච්ඡති

★ ඇතැම් විට ධාතුවේ මැදට තද්වර්ගාන්ත අනුනාසිකයක් පැමිණේ.

✓කෘත් + අ + ති > කෘන්තති
✓මුච් + අ + ති > මුඤ්චති
✓විද් + අ + ති > වින්දති

**10 ගණය** ඃ-" අය " විකරණය යෙදේ.

★ නාමින් ස්වර සහිත ඇතැම් හලන්ත ධාතු ගුණ වේ. ඇතැම් ඒවා ගුණ නොවේ.

✓තුල් + අය + ති > තෝලයති (ගුණ වේ)
✓ස්පෘහ් + අය + ති > ස්පෘහයති (ගුණ නොවේ)

★ නාමින් ස්වර රහිත ඇතැම් හලන්ත ධාතු වෘද්ධි වේ. ඇතැම් ඒවා වෘද්ධි නොවේ.

✓තඩ් + අය + ති > තාඩයති (වෘද්ධි වේ )
✓ගණ් + අය + ති > ගණයති (වෘද්ධි නොවේ )

★ ස්වරාන්ත ධාතුවල අග ස්වරය වෘද්ධි වේ.

✓ධෘ + අය + ති > ධාරයති
✓මෘ + අය + ති > මාරයති

★ හල් අකුරු දෙකකට වැඩි ගණනකට මුලින් ඇති ස්වරය ගුණ / වෘද්ධි නොවේ.

✓චින්ත් + අය + ති > චින්තයති
✓අර්ච් + අය + ති > අර්චයති

ධාතු අකර්මක, සකර්මක, ද්විකර්මක වශයෙන් ද
පරස්මෛපදී, ආත්මනේපදී හා උභයපදී වශයෙන් ද ප්‍රභේද ගත වේ.

ආඛ්‍යාත වරනැඟෙන විභක්ති ලකාර නමින් හැඳින්වේ. ඒවා 10කි. සාර්වධාතුක ලකාර හා ආර්ධ ධාතුක ලකාර යැයි ප්‍රභේද දෙකකි. සියලු ධාතු වරනැඟෙන ලකාර

සාර්වධාතුක ලකාර නම් වේ. ධාතුවට විකරණය එකතු වීමෙන් පසු ප්‍රත්‍යය එකතු වී වරනැඟීම මෙහි ලක්‍ෂණය යි. ඒවා නම් ලට්, ලඞ් , ලෝට්, විධිලිඞ් ය.

සාර්වධාතුක ලකාරවලින් ලට්, ලඞ් <u>කාල</u> යනුවෙන් ද ලෝට්, විධිලිඞ් <u>ප්‍රකාර</u> යනුවෙන් ද හැඳින්වේ. ආර්ධධාතුක ලකාර යනු විකරණ එකතු නොවී කෙළින් ම ප්‍රත්‍යය එකතු වී වරනැගෙන ලකාරයෝ ය. විකරණ රහිත නිසා ධාතුව අර්ධ පූර්ණ ය.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ධාතු ගණ 10 හා විකරණ දැක්වෙන කෙටි සටහනක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- වරනැගෙන ආකාරය අනුව ධාතු ගණ 10ක් ඇති බව අවබෝධ කරවන්න.
- විකරණයේ බලපෑම ගණ වශයෙන් වෙනස් වීමට හේතුව බව තහවුරු කරන්න.
- 1, 4, 6, 10 ගණ ධාත්වංගය අකාරාන්ත ව සිටින බැවින් පළමු වර්ගයේ ධාතු බවත් ඉහත ලක්ෂණය නොමැති නිසා අනික් ඒවා දෙවැනි වර්ගයේ ධාතු ලෙසත් නම් කෙරෙන බව තහවුරු කරන්න.
- එක් එක් ධාතු ගණය එහි ඇති විශේෂ ලක්‍ෂණ සහිත ව තේරුම් ගැනීමට සිසුන්ට සහාය වන්න.
- මිශ්‍ර කළ ක්‍රියා පද මාලාවක් දී ඒවා අදාළ ගණ යටතේ වර්ග කර දක්වන ලෙස පැවරුමක් දෙන්න
- පහත සටහන විශාල කොට සකසා සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

සාර්වධාතුක ලකාර

- ලට් — කාලවාචක (වර්තමාන) - **භවති**
- ලඞ් — කාලවාචක ( අතීත ) - **අභවත්**
- ලෝට් — ප්‍රකාර බෝධක - **භවතු**
- විධිලිඞ් — ප්‍රකාර බෝධක - **භවේත්**

ආර්ධධාතුක ලකාර

- ලුඞ් — කාලවාචක (අතීත) - **අභූත්**
- ලිට් — කාලවාචක (අතීත) - **බභූව**
- ලුට් — කාලවාචක (අනාගත) - **භවිතා**
- ලෘට් — කාලවාචක (අනාගත) - **භවිෂ්‍යති**
- ආශිර් ලිඞ් — ප්‍රකාර බෝධක - **භූයාත්**
- ලෘඞ් — ප්‍රකාර බෝධක - **අභවිෂ්‍යත්**

- උක්ත සටහන ප්‍රදර්ශනය කර ලකාර 10ක් ඇති බවත් ඒවා සාර්වධාතුක හා ආර්ධධාතුක වශයෙන් ප්‍රභේදගත වන බවත් වටහා දෙන්න.
- සාර්වධාතුක හා ආර්ධධාතුක යන වචනාර්ථ පැහැදිලි කර දෙන්න.
- සාර්වධාතුක ලකාර 04ක් බව තහවුරු කරන්න.
- එක් එක් ලකාරයේ ප්‍රත්‍යය වෙන් වෙන් ව ලබා දෙන්න.
- ඒ ඒ ප්‍රත්‍යයමාලාව සිසුන් සමඟ යම් තාල රටාවකට කිහිප වරක් උච්චාරණය කරන්න.
- ධාතු කිහිපයක් දී ලකාර හතරේ ම වරනගන ලෙස උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ධාතු ගණ 10 මතකයෙන් කියයි.
- පළමු වරනැඟීම හා දෙවැනි වරනැඟීම වශයෙන් ප්‍රභේද දෙකක් ඇති බව ප්‍රකාශ කරයි.
- ධාතුවලට විකරණ එකතු කොට ධාත්වංග ලියා දක්වයි.
- 1, 4, 6, 10 ධාතු ගණවල විශේෂතා සටහන් කරයි.

- මිශ්‍ර කළ ක්‍රියා පද ඒ ඒ ධාතු ගණ යටතේ පෙළ ගස්වයි.
- ලකාර 10 (දහය) මතකයෙන් කියයි.
- සාර්වධාතුක හා ආර්ධධාතුක යන වචනවල අර්ථ ප්‍රකාශ කරයි.
- ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ් සාර්වධාතුක ලකාර ලෙස නම් කරයි.
- ඒ ඒ ලකාරවල ප්‍රත්‍යයයන් තාලානුරූපී ව උච්චාරණය කරයි.
- ධාතු කිහිපයක් සාර්වධාතුක ලකාරවල වරනඟයි.
- පාඨ්‍ය ග්‍රන්ථයක් ඇසුරින් සාර්වධාතුක ලකාර පද උපුටා වගු ගත කරයි.

**වැඩි දුර ගවේෂණය**


- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල්, ඒ. ඒ.ඃ අනු ඃ ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1964.
- සංස්කෘත ශික්ෂකය, ප්‍රථම පුස්තකය, ජයසූරිය, එම්. එච්. එෆ්.ඃ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1971.

## 9. ඒකකය තද්ධිත

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.6 තද්ධිත හඳුනාගනියිල භාවිත කරයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- තද්ධිත හඳුනාගනියිල වර්ගීකරණය කරයි.
- රචනයේ දී තද්ධිත පද භාවිත කරයි.
- පාඨ්‍ය ග්‍රන්ථවල හමු වන විවිධ පද අතුරින් තද්ධිත පද වෙන් කොට හඳුනාගනියි.
- නාමයන්ට තද්ධිත ප්‍රත්‍යය එකතු කොට තද්ධිත පද නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

නාමයන්ට පර ව විවිධාර්ථවත් ප්‍රත්‍යය යෙදී සෑදෙන පද විශේෂය තද්ධිත නමින් හැඳින්වේ. (තස්‍ය - හිතඃ තද්ධිතඃ) ප්‍රමුඛ වශයෙන් තද්ධිත යන නම වඩාත් සුදුසු වන්නේ නාමයට එකතු කරන ප්‍රත්‍යය සඳහා ය. මූලික නාමයෙන් විවිධාර්ථවත් පද සාදා ගැනීමට එම ප්‍රත්‍යය නාමයට හිතවත් වීම ඊට හේතුව යි. අප්‍රධාන වශයෙන් නාමයෙන් පර ව ප්‍රත්‍යය යොදා සෑදෙන පදයට ද තද්ධිත යැයි ව්‍යවහාර කෙරේ.

නිද ඃ- 1. භූමි + [ඉකණ්] ⟵ තද්ධිතය

2. භූමි + ඉකණ් > [භෞමික] ⟵ තද්ධිතය

තද්ධිත පද සාදා ගැනීමේ දී විග්‍රහ වාක්‍යය වැදගත් වේ. ඉන් කියැවෙන අර්ථය නාමයට එකතු කරන ප්‍රත්‍යයෙන් මතු කර ගත යුතු බැවිනි. නාමයට ප්‍රත්‍යය එකතු කරන විට නාමයේ වෘද්ධි වීම් හා ආදේශ වීම් සිදු වේ.

නිදඃ- 1. විදේහ + අණ් > වෛදේහඃ
2. පටු + අණ් > පාටවඃ
3. මහතඃ භාවඃ > මහිමාන්

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- තද්ධිත පද සහිත කෙටි ප්‍රකාශයක් සකසා සිසුන්ට ලබා දෙන්න.
- එම ප්‍රකාශයේ ඇති තද්ධිත පද උපුටා පෙන්වමින් ඒවායේ අර්ථ සාකච්ඡා කරන්න.
- එම පද සකස් වී ඇත්තේ මූලික නාමයට ප්‍රත්‍යයක් එකතු වීමෙන් බව පද විශ්ලේෂණය කරමින් පෙන්වා දෙන්න.
- එම පද තද්ධිත නමින් හැඳින්වෙන බවත්, ඊට අමතර ව ප්‍රත්‍යය එම අර්ථය දරා සිටින බැවින් ප්‍රත්‍යය ම තද්ධිත ලෙස හඳුන්වන බවත් වටහා දෙන්න.
- පද වඩාත් කෙටි වීම ආදි ප්‍රයෝජන තද්ධිතවලින් ලැබෙන බව තහවුරු කරන්න.
- තද්ධිත පද සාදා ගන්නා ක්‍රමවේද නිවැරැදි ව විස්තර කර දෙන්න.
- තද්ධිත පදයේ ස්වරූපය අනුව තද්ධිතවල ප්‍රභේද අටක් ඇති බව පෙන්වා දෙන්න.
- නාම කීහිපයක් දී සුදුසු ප්‍රත්‍යය එකතු කොට තද්ධිත පද සෑදීමෙන් තද්ධිත පද ලැයිස්තුවක් දී එම පදවල ශබ්ද ප්‍රකෘතිය සෙවීමටත් උපදෙස් දෙන්න.
- එදිනෙදා භාවිත වන තද්ධිත පද ලැයිස්තුවක් සකස් කරන ලෙස උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- නාමයන්ට තද්ධිත ප්‍රත්‍යය එකතු කොට තද්ධිත පද නිර්මාණය කරයි.
- තද්ධිත පදවල නාමය වෙන් කොට දක්වයි.
- නිතර භාවිත වන තද්ධිත පද ලැයිස්තුවක් සකසයි.

**ගුණාත්මක යෙදවුම්**

- තද්ධිත ප්‍රභේද සහිත වගුවක්

**වැඩි දුර ගවේෂණය**

- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල්, ඒ. ඒ.ːඅනු ː ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1964.
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී, (කාරක-සමාස-තද්ධිත-තරඞ්ග) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.ːසමයවර්ධන, 1999.

## 10. ඒකකය කෘදන්ත

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.6 කෘදන්ත හඳුනාගනියිල භාවිත කරයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- කෘදන්ත යනු මොනවා දැයි හඳුන්වා ඒවා වර්ගීකරණය කරයි.
- රචනයේ දී කෘදන්ත පද භාවිත කරයි.
- කෘදන්ත පද ලැයිස්තුවෙන් කාලත්‍රයයට අයත් කෘදන්ත පද වෙන් කොට දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

කෘදන්ත යනු ධාතුවකින් සාදාගන්නා නාම පද විශේෂයකි. කාල වාචක, ත්‍රෛකාලික හා අව්‍යය වශයෙන් කෘදන්ත මූලික ප්‍රභේද තුනකි. කාලවාචක කෘදන්ත අතීත, වර්තමාන, අනාගත වශයෙන් ප්‍රභේද වන අතර ඒ සෑම එකක් ම නැවත කර්තෘකාරක, කර්මකාරක වශයෙන් කොටස් දෙකකට බෙදේ. ත්‍රෛකාලික කෘදන්ත කාලත්‍රයයෙහි වෙනසක් නොමැති ව පවතියි. අව්‍යය කෘදන්ත ද පූර්ව ක්‍රියා හා තුමන්ත ක්‍රියා යනුවෙන් කොටස් දෙකකට බෙදේ.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- කෘදන්ත වර්ගීකරණය දැක්වෙන සටහනක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ධාතුවකට ප්‍රත්‍යය එකතු වී සෑදෙන පද කෘදන්ත බව පැහැදිලි කර සටහනක් ආශ්‍රය කරගෙන එය වර්ග වන අයුරු පෙන්වා දෙන්න.
- වර්තමාන කෘදන්ත ''මාන, අත්'' යන ප්‍රත්‍යයවලින් ද , අතීත කෘදන්ත ''ත'' ප්‍රත්‍යයෙන් ද, අනාගත කෘදන්ත ''තව්‍ය, අණීය'' ප්‍රත්‍යයවලින් ද බොහෝ දුරට හඳුනාගත හැකි බව පෙන්වා දෙන්න.
- කාලත්‍රයයට අයත් බහුල ව යෙදෙන කෘදන්ත පද ලැයිස්තුවක් ලබා දී ඒවා ඒ ඒ කාල යටතේ වෙන් කොට ධාතුව සොයන ලෙස උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- කෘදන්ත යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- කෘදන්ත පද ලැයිස්තුවෙන් ත්‍රෛකාලික කාලවාචක හා අව්‍යය කෘදන්ත පද වෙන වෙන ම වර්ග කර දක්වයි.
- කෘදන්ත පදවල ධාතු වෙන් කර ලියයි.
- පාඨ්‍ය ග්‍රන්ථවලින් හමු වන කෘදන්ත පද ලැයිස්තුගත කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- කෘදන්ත වර්ගීකරණය දැක්වෙන සටහන

**වැඩිදුර ගවේෂණය**


- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල්, ඒ. ඒ.:අනු: ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1964.
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී, (ආඛ්‍යාත හා කෘදන්ත තරඞ්ගය) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.:සමයවර්ධන, 1999.

# 11. ඒකකය සමාස

**2.0 නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.7 සමාස හඳුනාගනියිල භාවිත කරයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- සමාස ප්‍රභේද නම් කරයි.
- සමාස ප්‍රභේදවල විශේෂතා දැන ප්‍රකාශ කරයි.
- සමාස පද විශ්ලේෂණය කරයි.
- විසිරී ඇති පද ආශ්‍රය කරගෙන සමාස පද ගොඩනැඟීමේ හැකියාව ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සමාස යනු පද කිහිපයක් එකතු කිරීමෙන් කෙටි කොට දැක්වීම යි. පද සමාස වීමේ දී අවසාන පදයේ විභක්ති ප්‍රත්‍යය හැර සෙසු පදවල විභක්ති ප්‍රත්‍යය ඉවත් වේ.

| | | |
|---|---|---|
| උදා ඃ- | කරටකඃ දමනකඃ | > කරටකදමනකෞ |
| | රාඥඃ පුත්‍රඃ | > රාජපුත්‍රඃ |
| | දේවානාං ලෝකඃ | > දෙවලෝකඃ |
| | පතිතං ඵලම් | > පතිතඵලම් |

සමාස ප්‍රභේද 06කි. ඒවා ද්වන්ද්ව, කර්මධාරය, ද්විගු, තත්පුරුෂ, බහුව්‍රීහි, අව්‍යයීභාව නම් වෙයි.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- වෙන් ව පවත්නා නාම පද දෙකක් හෝ වැඩි ගණනක් එකතු හෝ කොට එක් නාම පදයක් වන සේ ගැළපීම සමාස නම් වන බව ප්‍රකාශ කරමින් පාඩමට පිවිසෙන්න.
- සමාස ප්‍රභේද හා ඒවායේ ලක්ෂණ පිළිබඳ අවබෝධ කරවන්න.
- සමාස පද ලැයිස්තුවක් ලබා දී ඒවා සිසුන් සමග විශ්ලේෂණය කරන්න.
- පාඨ්‍ය ග්‍රන්ථයක කොටසක් නිර්දේශ කොට, එහි ඇති සමාස පද හඳුනාගැනීමට හා ඒවා විශ්ලේෂණය කිරීමට උපදෙස් දෙන්න.
- පද කිහිපයක් ලබා දී සමාස කරන ලෙස උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සමාස ප්‍රභේද නම් කරයි.
- සමාස පද විශ්ලේෂණය කරයි.
- විසිරී ඇති පද ආශ්‍රය කරගෙන සමාස පද ගොඩනගයි.

**ගුණාත්මක යෙදවුම්**

- සමාස ප්‍රභේද දැක්වෙන සටහනක්

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී, (කාරක-සමාස-තද්ධිත තරඞ්ගය) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.ඃසමයවර්ධන, 1999
- A Higher Sanskrit Grammar, Kale, M.R.: Delhi,1995

## 12. ඒකකය ප්‍රත්‍යයාර්ථ ක්‍රියා

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.8 ප්‍රත්‍යයාර්ථ ක්‍රියා හඳුනාගනියි; භාවිත කරයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- ප්‍රත්‍යයාර්ථ ක්‍රියා හඳුනාගනියි.
- ප්‍රත්‍යයාර්ථ ක්‍රියාවල ප්‍රභේද නම් කරයි.
- ඒ ඒ ප්‍රභේද යටතේ ප්‍රත්‍යයාර්ථ ක්‍රියා වෙන් කර දක්වයි.
- ප්‍රත්‍යයාර්ථ ක්‍රියා පද සාධනය කරයි.
- ලේඛනයේ දී ප්‍රත්‍යයාර්ථ ක්‍රියා නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

විශේෂාර්ථවත් ප්‍රත්‍යය ධාතුවට එකතු කිරීමෙන් ඒ ප්‍රත්‍යයයේ අර්ථය ප්‍රබලත්වයට පත් කෙරේ නම් එබඳු ක්‍රියා ප්‍රත්‍යයාර්ථ ක්‍රියා නම් වෙයි. ''කරෝති'' ආදි ක්‍රියා මගින් ධාතුවේ අර්ථය ප්‍රකට කරයි. ඒ නිසා ඒවා ප්‍රාථමික ක්‍රියා ය. එහෙත් ''කාරයති'' යන්න ප්‍රත්‍යයේ අර්ථය ප්‍රකට කරන බැවින් ඒවා අප්‍රාථමික ක්‍රියා හෙවත් ප්‍රත්‍යයාර්ථ ක්‍රියා නම් වේ. ප්‍රත්‍යයාර්ථ ක්‍රියා පහත පරිදි ප්‍රභේද ගත වේ.

1. ප්‍රයෝජ්‍ය ක්‍රියා
2. ඊප්සිතාර්ථ ක්‍රියා
3. අතිශයාර්ථ ක්‍රියා වශයෙනි.

ධාතුව හා ආඛ්‍යාත ප්‍රත්‍යයය අතරට ''අය'' යන්නක් එක් වී සෑදෙන ක්‍රියා ප්‍රයෝජ්‍ය ක්‍රියා නම් වේ. තවෙකෙකු ක්‍රියාව සඳහා පෙලඹවීම මෙහි ස්වභාවයයි.

✓බුධ් + ති > බෝධති - ✓බුධ් + අය + ති > බෝධයති
✓නී + ති > නයති - ✓නී + අය + ති > නායයති
✓කෘ + ති > කරෝති - ✓කෘ + අය + ති > කාරයති

ධාතුවත් ආඛ්‍යාත ප්‍රත්‍යයත් අතරට ''ස'' යන්නක් එකතු වී සෑදෙන ක්‍රියා ඊප්සාර්ථ ක්‍රියාවයි. ''ස'' යන්න එකතු වූ විට ධාතුවේ ස්වර සහිත මුල් ස්වරය ද්විත්ව වේ. කරන්නට හෝ වන්නට කැමති බව හැඟවීම මෙම ක්‍රියාවේ උපයෝගීතාවයි.

✓ජීව් > ජිජීව් + ස > ජිජීව් + ඉ + ස > ජිජීවිෂ + ති > ජිජීවිෂති
✓තෲ > තිතීර් + ස > තිතීර්+ ස > තිතීර්ෂ + ති > තිතීර්ෂති

බොහෝ සෙයින් කිරීමක් හෝ වීමක් හෝ නැවත නැවත කිරීමක් හෝ වීමක් හෝ හැඟවීම සඳහා යොදා ගන්නේ අතිශයාර්ථ ක්‍රියා ය. ක්‍රියා නිෂ්පත්තියේ දී ධාතුවේ මුල් අකුර ද්විත්ව වේ.

✓භූ - භවති > බෝභූයතේ
✓තප් - තපති > තාතප්‍යතේ
✓නී - නයති > නේනීයතේ

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ප්‍රාථමික ක්‍රියා පදය ද එහි අප්‍රාථමික ක්‍රියා පදය හෙවත් ප්‍රත්‍යයාර්ථ ක්‍රියා පදය ද වෙන වෙන ම ලියා දක්වා ඒවායේ අර්ථයේ විශේෂතා පිළිබඳ සාකච්ඡා කරන්න.

- ප්‍රත්‍යයාර්ථ ක්‍රියාවල ප්‍රත්‍යයයේ අර්ථය ප්‍රබල බව වටහා දෙන්න.
- එහි ප්‍රභේද නම් කර සිසුන් සමඟ පද සාධනය කරන්න.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා, ඊප්සිතාර්ථ ක්‍රියා හා අතිශයාර්ථ ක්‍රියා පද මාලාවක් ලබා දී ඒවා වෙන් කිරීමට උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ප්‍රත්‍යයාර්ථ ක්‍රියාවල ප්‍රභේද නම් කරයි.
- ප්‍රත්‍යයාර්ථ ක්‍රියා පද සාධනය කරයි.
- ඒ ඒ ප්‍රභේද යටතේ ක්‍රියා වෙන් කර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- ප්‍රත්‍යයාර්ථ ක්‍රියා හා ප්‍රාථමික ක්‍රියාවල අර්ථය සහිත සටහනක්

**වැඩි දුර ගවේෂණය**


- A Higher Sanskrit Grammar, Kale, M.R.: Delhi,1995
- නාමාඛ්‍යාත පද මාලා, පූජ්‍ය පේමරතන හිමි, වරාගොඩ.:සමයවර්ධන, 1995

# 13. ඒකකය අව්‍යය පද

**2.0 නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.9 අව්‍යය පද හඳුනාගනියි; භාවිත කරයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- අව්‍යය යනු කුමක් දැයි පැහැදිලි කොට ඒවා ප්‍රභේද වශයෙන් නම් කරයි.
- පාඨ්‍ය ග්‍රන්ථවල ඇති අව්‍යය පද වර්ගීකරණය කරයි.
- අව්‍යය පද යොදා සරල වාක්‍ය නිර්මාණය කිරීමේ හැකියාව ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

අව්‍යය යනු වෙනස් නොවන හෙවත් වර නොනැඟෙන පද යි. අව්‍යය පදවල ලිඞ්ග, විභක්ති හා වචන භේදයක් නැත. උපසර්ග, නිපාත, පූර්ව ක්‍රියා හා තුමන්ත ක්‍රියා වශයෙන් අව්‍යය විවිධ ය. (2-1 නිපුණතා මට්ටමට අදාළ පාඩම් සැලසුමේ උපසර්ග හා නිපාත පිළිබඳ සටහන බලන්න) තුමන්ත යනු ''තුම් '' යන ප්‍රත්‍යයයෙන් අන්ත වන පද යි. ගන්තුම්, වක්තුම් යනු උදාහරණ යි. ධාතුවට ''තුම්'' ප්‍රත්‍යය එකතු වී පද සෑදේ. පූර්ව ක්‍රියා යනු අවසාන ක්‍රියාවට මුලින් යෙදෙන, සිදු කර අවසන් වූ ක්‍රියා පද යි. ''ත්වා'' හා ''ය'' ''ත්‍ය'' ප්‍රත්‍යය පූර්ව ක්‍රියා සාධනයේ දී යොදා ගැනේ. ශුද්ධ ධාතුවෙන් පර ව ''ත්වා'' ප්‍රත්‍යය ද උපසර්ග සහිත අශුද්ධ ධාතුවෙන් පර ව ''ය'' ''ත්‍ය''ප්‍රත්‍යය ද යොදා ගැනේ.

උදා ඃ- කෘ + ත්වා > කෘත්වා
නී + ත්වා > නීත්වා
ගම් + ත්වා > ගත්වා
ප්‍ර + විශ් + ය > ප්‍රවිශ්‍ය
උප + ගම් + ය > උපගම්‍ය
ආ + නී + ය > ආනීය

හ්‍රස්ව ස්වරයක් අන්ත වූ සෝපසර්ග ධාතුවෙන් පර ව "ත්‍ය" ප්‍රත්‍යය යෙදේ.

උදා ඃ- අව + චි + ත්‍ය > අවචිත්‍ය
වි + ජි + ත්‍ය > විජිත්‍ය

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- අව්‍යය පද බෙදී යන අයුරු දැක්වෙන පුවරුවක් සකස් කර සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- න + ව්‍යය = අව්‍යය වන බැවින් ඉන් වෙනස් නොවන යන තේරුම ලැබෙන බවත් සිසුන්ට වටහා දෙන්න.
- අව්‍යය ප්‍රභේද සහිත ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පද සාදාගන්නා අයුරු සරල නිදර්ශන උපයෝගී කරගනිමින් පුවරුවේ ලියා දක්වමින් වටහා දෙන්න.
- පාඨ්‍ය ග්‍රන්ථවල ඇති අව්‍යය පද සිසුන් සමඟ වර්ගීකරණය කරන්න.
- අව්‍යය පද යොදා ගනිමින් සරල වාක්‍ය නිර්මාණය කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- අව්‍යය යන්නෙහි අදහස විස්තර කරයි.
- අව්‍යය ප්‍රභේද වශයෙන් නම් කරයි.

- අව්‍යය පද වර්ගීකරණය කර ලියයි.
- අව්‍යය පද යොදා සරල වාක්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- අව්‍යය පද බෙදී යන අයුරු දැක්වෙන පුවරුවක්

**වැඩි දුර ගවේෂණය**

- A Higher Sanskrit Grammar, Kale, M.R.: Delhi,1995
- සංස්කෘත ශික්ෂකය III, පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.: මොඩර්න්, නුගේගොඩ, 1964
- සංස්කෘත ප්‍රථම පුස්තකය, භාණ්ඩාර්කර්, ආර්.ජී.:කොළඹ, 1958

## 14. ඒකකය අර්ථාවබෝධය (නිර්දිෂ්ට ගද්‍ය)

**3.0 නිපුණතාව**

කියවා අර්ථය අවබෝධ කරගනියි.

**නිපුණතා මට්ටම**

3.1 සරල ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි.

**කාලච්ඡේද 09**

**ඉගෙනුම් පල**

- සරල ගද්‍ය පාඨ නිවැරැදි ව කියවයි.
- සරල ගද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර ලියා දක්වයි.
- උද්ධෘත පාඨවල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පෙන්වා දෙයි.
- සන්ධි සමාස සහිත පද නිවැරැදි ව උච්චාරණය කරයි.
- පාඨයන්ගේ සමස්ත අර්ථය අවබෝධ කොටගෙන මතකයෙන් ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත බාලාදර්ශ, ප්‍රථමාදර්ශ, ද්විතීයාදර්ශ යන කෘතිවලින් තෝරාගත් කොටස් භාවිත කිරීම සුදුසු වේ. (විෂය නිර්දේශයේ දක්වා ඇති නිර්දිෂ්ට ග්‍රන්ථ කෙරෙහි අවධානය යොමු කරන්න.) ඇතැම් භාෂාවල මෙන් ම සංස්කෘත භාෂාවේ ද වාක්‍යයක පද යෝජන පිළිවෙළ පිළිබඳ නියමයක් නැත. සංස්කෘත වාක්‍යයක මුලින් ම හඳුනාගත යුත්තේ එහි ආඛ්‍යාතය යි. ආඛ්‍යාතය හා බැඳුණු කර්තෘ පද හඳුනාගත යුතු ය. ඉන් පසු ආඛ්‍යාතය අනුව කර්තෘගේ වචන භේදය හඳුනාගත යුතු ය. නාම පදවල කාරක හා විභක්ති හඳුනාගත යුතු ය. විශේෂණ, අව්‍යය පද ආදිය ද හඳුනාගත යුතු ය.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සිසුන් ලවා නිර්දිෂ්ට පාඨය ශබ්ද නඟා නිවැරැදි ව කියවීමට සලස්වන්න.
- අදාළ පාඨයේ සන්ධි පද විසන්ධි කිරීමටත් ආඛ්‍යාත හා කර්තෘ ආදි සෙසු පද හඳුනාගැනීමටත් සලස්වන්න.
- එම වාක්‍යයන්හි සමස්ත අර්ථ ලබාගැනීමට සලස්වන්න.
- එහි අර්ථාවබෝධය සහිත ව නැවත ශබ්ද නඟා කියවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සරල ගද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- උද්ධෘත පාඨවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය පෙන්වාදෙයි.
- සන්ධි සමාස සහිත පද නිවැරැදි ව උච්චාරණය කරයි.
- පාඨයන්ගේ සමස්ත අර්ථය හඳුනාගෙන මතකයෙන් ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට කෘතිවලින් තෝරාගත් පාඨ ඇතුළත් ඡායා පිටපත්

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත ශික්ෂකය, ප්‍රථම පුස්තකය, ජයසූරිය, එම්.එච්.එෆ්.: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ, 1961
- සංස්කෘත පාඨමාලා, තිලකසිරි, ජේ.:කොළඹ, 1960
- A Sanskit Reader, Lanman, C.R.: Cambridge, Harward University Press, 1947

## 15. ඒකකය - අර්ථාවබෝධය (නිර්දිෂ්ට පද්‍ය)

**3.0 නිපුණතාව**

කියවා අර්ථය අවබෝධ කරගනියි.

**නිපුණතා මට්ටම**

3.2 සරල පද්‍ය පාඨ, මිශ්‍ර පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි.

**කාලච්ඡේද** 09

**ඉගෙනුම් පල**

- සරල පද්‍ය පාඨ හා ගද්‍ය පද්‍ය මිශ්‍ර පාඨ අර්ථාවබෝධයෙන් යුක්ත ව ශබ්ද නඟා කියවයි.
- එම පාඨ නිවැරැදි ව මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- සරල පද්‍ය පාඨ හා ගද්‍ය පද්‍ය මිශ්‍ර පාඨ නිවැරැදි ව ලියයි.
- විශේෂ ශ්ලෝක පාඨ වාචෝද්ගත කරයි.

**පාඩම් සැලසුම් හා උපදෙස්**

සංස්කෘත භාෂාවේ පද්‍යයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. එහි පද්‍යයෙන් තොර ගද්‍ය හමු වන්නේ කලාතුරකිනි. එනිසා පද්‍ය පාඨයක් අවබෝධ කරගැනීමේ ශක්තිය ලබාදීම අතිශය වැදගත් ය. සංස්කෘත පද්‍යයක පද යෝජන පිළිවෙළ ගද්‍ය පාඨයකටත් වඩා ස්වාධීන ය. පද්‍යයක් කිසියම් වෘත්තයකින් නිබද්ධ ව ඇත. ගද්‍යයෙන් පද්‍ය වෙනස් වීමේ ප්‍රධාන සාධකය එය යි. විෂය නිර්දේශයේ දක්වා ඇති නිර්දිෂ්ට ග්‍රන්ථ කෙරෙහි අවධානය යොමු කරමින් පාඩම සැලසුම් කරන්න.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ව්‍යාසකාර, හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර, මහාභාරත, රාමායණ යන කෘතිවලින් තෝරාගත් කොටස් පරිවර්තනය කරවන්න.
- සිසුන් ලවා පද්‍යයක් ශබ්ද නඟා නිවැරැදි ව විරිතට අනුව කියැවීමට සලස්වන්න.
- අදාළ පාඨයේ සන්ධි පද විසන්ධි කිරීමටත් ආඛ්‍යාතය, කර්තෘ සහ සෙසු පදවල කාර්යයන් හඳුනාගැනීමටත් සලස්වන්න.
- සමස්ත පාඨයේ අර්ථය ලබාගැනීමට සලස්වන්න.
- පාඨය අර්ථාවබෝධයෙන් යුක්ත ව නැවත ශබ්ද නඟා කියවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- දෙන ලද පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- පද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුක්ත ව ශබ්ද නඟා කියවයි.
- විශේෂ ශ්ලෝක පාඨ වාචෝද්ගත කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ
- පරිවර්තනය කරන ලද පද්‍ය ඛණ්ඩ කීපයක් සහිත පුවරුවක්

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත ශික්ෂකය, ප්‍රථම පුස්තකය, ජයසූරිය, එම්.එච්.එෆ්.: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ, 1961
- සංස්කෘත පාඨමාලා, තිලකසිරි, ජේ.: කොළඹ, 1960
- A  Sanskit Reader, Lanman, C.R.: Cambridge, Harward University Press, 1947

## 16. ඒකකය - සාහිත්‍ය නිර්මාණ

**4.0 නිපුණතාව**

සාහිත්‍ය රසාස්වාදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4.1 සාහිත්‍යාත්මක නිර්මාණයක ලක්ෂණ හඳුනාගනියි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- සාහිත්‍ය රසාස්වාදන ශක්‍යතා වර්ධනය කරගනියි.
- ජීවිතය දෙස සෞන්දර්යාත්මක හා සංවේදී ඇසකින් බැලීමට හුරු වෙයි.
- තමා ලද සාහිත්‍ය වින්දන හැකියාව අන්‍යයන් හා බෙදාගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත බාලාදර්ශ, ප්‍රථමාදර්ශ, ද්විතීයාදර්ශ යන කෘතිවලින් උපුටාගත් කොටස් රස වින්දනය සඳහා යොදාගන්න. විස්තර සඳහා විෂය නිර්දේශයේ දක්වා ඇති නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය කරන්න. උපදේශ කථාවන්ගේ මූලාරම්භය වෛදික සාහිත්‍යය ඔස්සේ හා වීර කාව්‍ය ඔස්සේ ගොඩනැගුණ එකකි. පශ්චාත්කාලීන ප්‍රධාන උපදේශ ග්‍රන්ථ වන පංචතන්ත්‍ර - හිතෝපදේශ ග්‍රන්ථවලින් අන්තර්ගත ප්‍රධාන හා අතුරු කතා මඟින් උපදේශ ම ප්‍රකාශ කරයි. උපදේශ ග්‍රන්ථවල එන සත්ත්ව හා පුද්ගල චරිතවලින් සමාජයට උපදෙස් ලබාගත හැකි ය. සත්ත්වයන්ගේ චරිත මඟින් මිනිස් චරිතවල අඩුපාඩු සකසාගැනීමට හැකියාව ඇත. භාෂා ප්‍රවර්ධනය මතු නො ව ජීවිතාවබෝධය පිණිසත් මානව සමාජය හා පරිසරය විෂයයෙහි ස්නේහාන්විත ආකල්පයක් ඇති කිරීම පිණිසත් උපකාර වේ.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සංස්කෘත සාහිත්‍යයේ අන්තර්ගත උපදේශාත්මක අගයෙන් යුක්ත කතා එක්රැස් කරගන්න.
- තෝරාගත් පාඨයක් ආශ්‍රයයෙන් සාහිත්‍ය නිර්මාණයක ලක්ෂණ හඳුනාගැනීමට ඉඩ සලසන්න.
- පාඨය අයත් වන සාහිත්‍යාංගය අනුව භාෂා විලාසය වෙනස් වන බව පැහැදිලි කරන්න.
- වීරකාව්‍ය හා උපදේශකාව්‍ය අතර වෙනස පෙන්වා දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- දෙනු ලබන පාඨවල අර්ථ හා උපදේශාත්මක ලක්ෂණ වෙන් කර හඳුනාගනියි.
- දෙන ලද උද්ධෘත පාඨයක්, වර්ණනාවක් ද, කථාවක කොටසක් ද, උපදේශයක් ද වශයෙන් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- උපදේශ කථා හා වීර කව්‍ය සාහිත්‍යයේ විශේෂ ලක්ෂණ ගොනු කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් ඇතුළත් ඡායා පිටපත්
- අන්තර්ජාලයෙන් තෝරාගත් උපදේශ සාහිත්‍යයේ කථා ඇතුළත් වීඩියෝ දර්ශන සහිත සීඩී තැටි

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත පාඨමාලා, තිලකසිරි ජේ.ඃ ගොඩගේ, 1990.
- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, තිලකසිරි ජේ.ඃ ගොඩගේ, 1999.
- ඃ සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය, කීත්, ඒ.බී. ගොඩගේ, 1990.

## 17. ඒකකය - සාහිත්‍ය රසාස්වාදනය

**4.0 නිපුණතාව**

සාහිත්‍ය රසාස්වාදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4.2 සාහිත්‍යාත්මක පාඨයක රසය විඳගනියි; ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 08**

**ඉගෙනුම් පල**

- නිර්මාණයක් ආශ්‍රයෙන් රස වින්දන හැකියාව ප්‍රදර්ශනය කරයි.
- ජීවිතය දෙස සෞන්දර්යාත්මක හා සංවේදී දෘෂ්ටියකින් බලා අදහස් ප්‍රකාශ කරයි.
- තමා ලද සාහිත්‍ය වින්දන හැකියාව අන්‍යයන් හා බෙදාගනියි.
- සංස්කෘත උපදේශ සාහිත්‍යයේ වටිනාකම අගයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

උපදේශ හා වීරකාව්‍ය සාහිත්‍යයට අයත් කෘතිවලින් උපුටාගත් කොටස් භාවිත කිරීම අවශ්‍ය වේ. විෂය නිර්දේශයේ දක්වා ඇති නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් එයට පහසුව සැලසෙනු ඇත. දෙන ලද සංස්කෘත පාඨවල සිංහල අර්ථය ඉගැනීමට හා පද විසන්ධි කොට සරලාර්ථය සෙවීමට හුරු කරවිය යුතු ය. අපේක්ෂිත අරමුණු සාධනයෙහි ලා තෝරාගන්නා ලද පාඨයෙහි යොදාගෙන ඇති භාෂා විලාසයෙහි යෝග්‍යතාව, අදාළ පාඨයේ අන්තර්ගත ශබ්දාලංකාර, අර්ථාලංකාර සහ වෙනත් කාව්‍යෝක්තීන් හඳුන්වාදෙන්න. අදාළ පාඨය කියවා ලැබෙන අත්දැකීම විඳගැනීමට සලස්වන්න.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උපදේශ ග්‍රන්ථ වන පංචතන්ත්‍ර - හිතෝපදේශ යන කෘතිවල ප්‍රධාන කථා හා අතුරු කතා අවබෝධ කර දී ඉන් මතු වන සත් හා අසත් චරිත හඳුන්වා දෙන්න.
- විශේෂිත උපදේශාත්මක ශ්ලෝක පාඨයන් රසාත්මක අයුරින් ශ්‍රවණය කිරීමට මඟ පාදා දෙන්න.
- අදාළ පාඨ අන්තර්ගත මුල් කෘතීන් අයත් වන සාහිත්‍ය ප්‍රභේද පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න
- අදාළ පද්‍ය පාඨ ශිෂ්‍යයන් ලවා ගායනා කරවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- දෙන ලද පාඨ කොටසක් ආශ්‍රය කරගෙන එහි උපදේශාත්මක, සාහිත්‍යාත්මක හා සමාජීය අගය මතු කරමින් ශිෂ්‍ය සමිතියේ කතාවක් පවත්වයි.
- උපදේශාත්මක කෙටි කතා නිර්මාණය කරයි.
- බිත්ති පුවත්පත් සඳහා උපදේශාත්මක ලිපි ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- රස වින්දනාත්මක අගයන් ඇති හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර හෝ රාමායණ, මහාභාරත යන කෘතිවලින් උපුටාගත් කොටස්
- උපදේශ කථා හා වීර කථා ඇතුළත් වීඩියෝ හා ඡායාරූප සහිත දෘශ්‍ය සංයුක්ත තැටි
- පරිගණකයක් / රූපවාහිනී යන්ත්‍රයක්

## 18. ඒකකය - සාරධර්ම හඳුනාගැනීම

**5.0 නිපුණතාව**

භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම චරිතාබද්ධ කරයි; ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම**

5.1 පාඨයක අන්තර්ගත සාරධර්ම හඳුනාගනියි; චරිතාබද්ධ කරයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- සංස්කෘත සාහිත්‍යයේ එන සාරධර්මවල සමාජ උපයෝගිතාව හඳුනාගනියි.
- සංස්කෘත සාහිත්‍යය සාර්වකාලීන හා සාර්වභෞමික අගයකින් යුක්ත බව හඳුනාගනියි.
- සාර්ථක ජීවිතයක් ගොඩනැඟීමෙහි ලා සංස්කෘත සාහිත්‍යාගත සාරධර්ම අතිශයෝපකාරී බව වටහාගෙන භාවිත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සාරධර්ම චරිතාබද්ධ කරගැනීම විෂයාභිරුචිය මතු නොව ජීවිතාවබෝධයෙහි ලා ද අත්‍යවශ්‍ය ක්‍රියාකාරකමක් බව පෙන්වා දිය යුතු වේ. තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය හෝ පාඨයේ අන්තර්ගතය අවබෝධ වන සේ පැහැදිලි කරදීම ද සාරධර්මයන්හි සාර්වකාලීන භාවය මතු කොට පෙන්වීමට ද යොමු විය යුතු ය. අනිර්දිෂ්ට පාඨයන්ගෙන් ප්‍රකාශ 10ක් පමණ පහත දක්වා ඇත. පහත පරිදි තෝරාගත් පාඨ ඇසුරින් නිපුණතා මට්ටම ආවරණය කරන්න.

උදාහරණ -

ජගදුපකෘතිරේව බුද්ධපූජා

න හි සංහරතේ ජ්‍යෝත්ස්නාශ්චන්ද්‍රශ්චණ්ඩාලවේශ්මනී

දත්ත දම්‍යත දයධ්වම්

උදාරචරිතානාන්තු වසුධෛව කුටුම්බකම්

විද්‍යා දදාති විනයම්

උත්තිෂ්ඨත, ජාග්‍රත, ප්‍රාප්‍ය වරාන් නිබෝධත

වෘක්‍ෂාඃ සත්පුරුෂා ඉව

ඡදනේ චේන් මධූ වින්දේත කිමර්ථං පර්වතං ව්‍රජේත්

සුකෘතං දුෂ්කෘතං චෛව ගච්ඡන්තමනුගච්ඡති

ව්‍යවහාරේණ මිත්‍රාණි ජායන්තේ රිපවස්තථා

ඉහත සඳහන් ආකාරයේ සාරධර්ම පාඨ නිර්දිෂ්ට පාඨයන් ගෙන් ද හඳුනාගෙන මතු කොට පෙන්වන්න.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- තෝරාගත් සාරධර්ම පාඨ ආශ්‍රයයෙන් සාරධර්ම පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කීපයකට බෙදා ඔවුන්ට සාරධර්ම පාඨ රැස් කිරීමට උපදෙස් දෙන්න.
- එක් එක් ශිෂ්‍යයාට අභිමත සාරධර්ම පාඨයක් තෝරාගෙන ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසාදෙන්න.
- හඳුනාගත් සාරධර්ම පාඨයන්හි සමාජ උපයෝගීතාව විග්‍රහ කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ශිෂ්‍ය සංගම්වල දී, පන්තිය ඉදිරියේ දී, සාරධර්ම අන්තර්ගත සංස්කෘත ප්‍රකාශ භාවිත කරමින් අදහස් දක්වයි.
- දෛනික පුවත්පත්, බිත්ති පුවත්පත්, සඟරා ආදියට උක්ත සාරධර්ම ප්‍රකාශ පදනම් කොට ගෙන කුඩා නිර්මාණ කිරීමට හුරු වෙයි.
- නිතර නෙත ගැටෙන ස්ථානවල සාරධර්ම ඇතුළත් ප්‍රකාශ සකස් කර ප්‍රදර්ශනය කරයි; කියවයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ
- රූප සටහන්, වගු, වෙනත් පාඨ්‍ය ග්‍රන්ථ
- සාරධර්ම ඇතුළත් ප්‍රකාශ ඇසුරින් ගොනු කරන ලද පත්‍රිකා
- අන්තර්ජාලයෙන් තෝරාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය සාරධර්ම කොටස් ඇතුළත් පාඨ

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත පාඨමාලා, තිලකසිරි ජේ.ඃ ගොඩගේ, 1990.
- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය,තිලකසිරි ජේ.ඃ ගොඩගේ, 1999.
- සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය, කීත්, ඒ.බී.ඃ ගොඩගේ, 1990.

## 19. ඒකකය - සාරධර්ම ඇගයීම

**5.0 නිපුණතාව**

භාෂා සාහිත්‍ය තුළ අන්තර්ගත සාරධර්ම චරිතාබද්ධ කරයි; ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම**

5.2 සාරධර්ම අගයයි; ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** 08

**ඉගැනුම් පල**

- සාරධර්ම හඳුනාගනියි; අගයයි; චරිතයට සමීප කරගනියි.
- උගත් සාරධර්ම පිළිබඳ ව විවේචනාත්මක මනසකින් දැකීමේ ශක්‍යතාව ඇති කොටගනියි.
- ජීවිත පරිඥානය ලබයි.
- සාර්ථක ජීවිතයක අඩංගු ලක්ෂණ සංස්කෘත සාහිත්‍ය ඇසුරින් පෙළ ගස්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

නිර්දිෂ්ට පාඨයන්හි සාරධර්ම අඩංගු ප්‍රකාශ කිහිපයක් තෝරා ගෙන ඒවායෙහි අගය විග්‍රහ කරන්න. ජීවිත පරිඥානය උදෙසා සාරධර්මයන්හි ඇති සර්වකාලීන වටිනාකම මතු කොට දක්වන්න. එදිනෙදා ජීවිතයේ අත්විඳින සමාජ දුරාචාර මෙම සාරධර්ම සමාජගත කිරීමෙන් අවම කළ හැකි බව පෙන්වා දෙන්න. සාරධර්ම පාරලෞකික මතු නොව ඓහලෞකික ශුභසිද්ධියට ඉවහල් වන බව අවධාරණය කිරීම වැදගත් වේ. සමාජ සාධාරණත්වය හා ගැටලු නිරාකරණය පිණිස සාරධර්ම අධ්‍යාපනය ආවශ්‍යක අංගයක් බවත්, එය සාර්ථක ව කළ හැක්කේ සංස්කෘත සාහිත්‍යය විමසීමෙන් බවත් පුද්ගලයා සාරධර්ම අධ්‍යාපනය මඟින් සුචරිතවත් සමාජයක් උදෙසා හික්මවිය හැකි බවත් පෙන්වා දෙන්න.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- පන්තියේ සිසුන් කණ්ඩායම් කොට නිර්දිෂ්ට කෘති වෙන වෙන ම කියවා සාරධර්ම අඩංගු ප්‍රකාශ වෙන් කොට ලිවීමට සලස්වන්න.
- කණ්ඩායම්වලට තමා එකතු කළ සාරධර්ම ප්‍රකාශ සෙසු කණ්ඩායම් ඉදිරියේ ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- තම කණ්ඩායම එකතු කළ සාරධර්ම ප්‍රකාශ විග්‍රහ කරමින් සමාජ සුචරිතයට හා පුද්ගල චරිත සංවර්ධනයට ඒවා උපයෝගී වන ආකාරය විග්‍රහ කරමින් කුඩා පැවරුමක් කිරීමට යොමු කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- උපුටා ගත් සාරධර්ම කොටස් නිවැරැදි ව කියවයි.
- කණ්ඩායම් මඟින් එකතු කළ සාරධර්ම නිර්දිෂ්ට කොටස් විමසා නැවත නිවැරැදි කරයි.
- දෙන ලද උපදේශාත්මක පාඨ වාචෝද්ගත කර ඉදිරිපත් කරයි.
- උගත් සාරධර්ම චරිතාබද්ධ කරගන්නා ආකාරය පිළිබඳ ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ

- රූප සටහන්, වගු, වෙනත් පාඨ්‍ය ග්‍රන්ථ
- සාරධර්ම ඇතුළත් ප්‍රකාශ  ඇසුරින් ගොනු කරන ලද පත්‍රිකා
- අන්තර්ජාලයෙන් තෝරාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය සාරධර්ම කොටස් ඇතුළත් පාඨ

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත පාඨමාලා, තිලකසිරි ජේ.ඃ ගොඩගේ, 1990.
- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, තිලකසිරි ජේ.ඃ ගොඩගේ, 1999.
- සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය, කීත්, ඒ.බී.ඃ ගොඩගේ, 1990.

## 20. ඒකකය - භාෂණයේ යෙදීම (ප්‍රශ්න හා පිළිතුරු)

**6.0 නිපුණතාව**

නිරවුල් ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

6.1 සරල ප්‍රශ්න අසයි.
6.2 ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 12

**ඉගෙනුම් පල**

- දෛනික අත්දැකීම් ඇසුරින් සංස්කෘතයෙන් සරල ප්‍රශ්න අසයි; පිළිතුරු දෙයි.
- වෙනත් භාෂා මෙන් සංස්කෘත භාෂාව ද අදහස් ප්‍රකාශ කිරීමට යොදාගනියි.
- සංස්කෘත භාෂණ හැකියාව අගය කරයි.
- සංස්කෘත භාෂා මාධ්‍යයෙන් ශිෂ්‍ය සමිතියක් මෙහෙයවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සිංහල භාෂාවේ ප්‍රශ්නාර්ථවාචී පද හැඳින්වීම හා ඒවාට අදාළ සංස්කෘත පරිවර්තනයන් පෙළ ගස්වා ගන්න. සංස්කෘත භාෂාවෙන් ප්‍රශ්නයක් ඇසීමේ දී සාමාන්‍ය වාක්‍යයකට ප්‍රශ්නාර්ථවාචී පද මුල, මැද හෝ අග හෝ යෙදිය හැකි ය. ප්‍රශ්නාර්ථවාචී වාක්‍යයක ද කර්තෘ, කර්ම හා ක්‍රියා යන කොටස් තුන අන්තර්ගත විය යුතු ය.

උදාහරණ :-

**कदा त्वं मुरवप्रक्षालनं करोषि** ?
**त्वं कदा मुरवप्रक्षालनं करोषि** ?
**त्वं मुरवप्रक्षालनं कदा करोषि** ?
**त्वं मुरवप्रक्षालनं करोषि कदा** ?

**යෝජිත ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- දෛනික සිදුවීම් පිළිබඳ ප්‍රශ්න සැකසීමේ දී භාවිත වන ප්‍රශ්නාර්ථවාචී පද හඳුන්වා දෙන්න.
- උදා :- **කථම්, කිම්, කුත්‍ර, ක්ව, කදා, කිමර්ථම්, කඃ, වා, අපි** යනාදි වශයෙනි.
- තදීය භාෂා ප්‍රයෝග හඳුන්වා දෙන්න.
- සරල ප්‍රශ්න ඇසීමට හා ප්‍රශ්නවලට පිළිතුරු දීමට සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘතයෙන් එදිනෙදා හමු වන සරල ප්‍රශ්න අසයි. ඒවාට පිළිතුරු දෙයි.
- කථන භාෂාවක් ලෙස සංස්කෘත භාවිත කළ හැකි බව පිළිගෙන භාවිත කරයි.
- සංස්කෘත භාෂාගත ආදර්ශ පාඨ එක්රැස් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- අන්තර්ජාලය භාවිතයෙන් ලබාගත් සංස්කෘත ප්‍රශ්නෝත්තර ඇතුළත් සංවාද
- කාලීන සිදුවීම් සහිත විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්ති ඇතුළත් සංයුක්ත තැටි

- ප්‍රශ්නාර්ථවාචී පද හා පිළිතුරු ඇතුළත් පුවරු කිහිපයක්

**වැඩි දුර ගවේෂණය**

- අන්තර්ජාලයෙන් Sanskrit conversation සෙවීමට උපදෙස් දීම
- සංස්කෘත ප්‍රථමාදර්ශය හා බාලාදර්ශය ආදි ග්‍රන්ථ

# 21. ඒකකය - භාෂණයේ යෙදීම (සංවාද)

**6.0 නිපුණතාව**

නිරවුල් ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

6.3 සරල උපදෙස් ලබාදෙයි.
6.4 ශබ්ද නිවැරැදි ව උච්චාරණය කරයි.
6.5 සංවාදයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 16

**ඉගෙනුම් පල**

- දෛනික ජීවිතයේ විවිධ අවස්ථාවල දී ශිෂ්‍යයා සංස්කෘත භාෂා මාධ්‍ය භාවිත කිරීමට උනන්දු වෙයි.
- සංස්කෘත භාෂාව නිරවුල් ව හා නිවැරැදි ව උච්චාරණ කිරීමට හැකියාව ලබයි.
- ආත්ම විශ්වාසයෙන් කථනයේ යෙදෙයි.
- සබකෝලයෙන් තොර ව සංස්කෘත භාෂාව කතා කිරීමට ඉදිරිපත් වෙයි.
- භාවිත සංස්කෘත සංවාදවල උපයෝගිත්වයෙන් චතුර ව සංවාදයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- දෛනික ජීවිතය හා සම්බන්ධ අවස්ථාවල දී සංස්කෘතයේ භාවිත ආචාර-සමාචාර විධි හඳුන්වාදෙන්න.
- උපවිශතු භවාන්; ප්‍රවිශතු භවාන්; ධන්‍යවාදඃ.
- නමස්තෙ/ නමො නමඃ,/ තථෛව අස්තු.
- සුප්‍රභාතම්/ තථෛව අස්තු / ශුභරාත්‍රිඃ.
- ස්වාගතම් / සුස්වාගතම්.
- කථමස්ති/ කුශලං තෙ/ අපි කුශලී භවසි/ කුශලං වා/ කො විශේෂඃ/ අහං කුශලී/ සමීචිනම්.
- ගච්ඡතු භවාන් පුනර්දර්ශනාය/ ගච්ඡාම්‍යහං පුනර්දර්ශනාය.
- අපි තපො වර්ධතේ? - ආම.
- ශුභමස්තු. තථෛව අස්තු.
- චිරං ජීව, දීර්ඝායුෂ්කො භව. චිරං ජයතු.
- වන්දේ / මම ප්‍රණාමඃ / ධන්‍යවාදඃ
- ක්ෂම්‍යතාම්/ මර්ෂතු භවාන්/ ශිවමස්තු තව පන්ථාඃ / සිද්ධිරස්තු.
- දත්ත දම්‍යත දයධ්වම්.
- ආයුෂ්මාන් / ආයුෂ්මතී භව / සෞභාග්‍යවාන් / සෞභාග්‍යවතී භව.

අල්පප්‍රාණ- මහාප්‍රාණ, ඌෂ්මාක්ෂරත්‍රය, සංයුක්තාක්ෂර, විසර්ගය, මූර්ධජ අක්ෂර හා ඍ ආදි ශබ්ද නිවැරැදි ව උච්චාරණය කිරීමට ශිෂ්‍යයා පොලඹවන්න. අක්ෂරෝත්පත්තිස්ථාන පිළිබඳ නිසි අවබෝධයෙන් යුතු ව නිවැරැදි ව උච්චාරණය කිරීමට උපදෙස් දෙන්න. ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි ආශ්‍රයෙන් නිවැරැදි උච්චාරණය හුරු කරවන්න. චතුර කථිකයකු වීමට නිවැරදි උච්චාරණයේ හා අවස්ථෝචිත වචන භාවිතයේ වැදගත්කම අවබෝධ කරවන්න.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- අදාළ වේලාවට ගැළපෙන ආචාර විධිය සංස්කෘතයෙන් භාවිත කර ප්‍රවේශය ලබාගන්න.
- මාතෘ භාෂාවෙන් ආචාරසමාචාර කරන අවස්ථා හා වචන මාලාව විමසමින් ඒවාට අනුරූප සංස්කෘත වචන පෙන්වාදෙන්න.

- දෙන ලද ආචාරසමාචාර විධි සංස්කෘතයට පෙරළීමට සහාය වන්න.
- සමාජයේ විවිධ කණ්ඩායම් අතර ඇති අන්තර් සම්බන්ධතාවල දී යොදාගනු ලබන
- ආචාරසමාචාර විධි ඇතුළත් වන සේ සිසුන් කාණ්ඩ කර භාෂණයේ යොදවන්න.
- ශ්‍රව්‍ය-දෘශ්‍ය තැටි ශ්‍රවණය කිරීමට සලස්වා ඒ අනුව නිවැරැදි ව පුනරුච්චාරණය කිරීමට සලස්වන්න.
- ශිෂ්‍යයන් බහුල ලෙස සාවද්‍ය ව උච්චාරණය කරන වචන හඳුනාගෙන ඒවා නිවැරැදි කරන්න.
- තෝරාගත් සංවාද පාඨ ශිෂ්‍යයන් ලවා ප්‍රතිරූපණය කරවන්න.
- නිර්දිෂ්ට ග්‍රන්ථාගත සංවාද කොටස් ඇසුරෙන් සිසුන් සංවාදයට යොමු කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘත භාෂාවෙන් ප්‍රශ්න අසයි.
- අසන ප්‍රශ්නවලට සංස්කෘත භාෂාවෙන් පිළිතුරු දෙයි.
- ආචාර සමාචාර කිරීමේ දී සංස්කෘත භාෂාව යොදාගනියි.
- අදහස් හුවමාරු කරගැනීමේ දී සංස්කෘත භාෂා මාධ්‍යයෙන් සංවාදයන්හි යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ
- අන්තර්ජාලයෙන් තෝරාගත් සංවාද කොටස්. ශ්‍රව්‍ය / දෘශ්‍ය.

**වැඩි දුර ගවේෂණය**

- සංවාද තවදුරටත් සොයා-බලා භාවිත කිරීම.
- අන්තර්ජාල පරිහරණය.

## 22. ඒකකය - ගද්‍ය, පද්‍ය පාඨ අර්ථාවබෝධය

**7.0 නිපුණතාව**

සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරැදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම**

7.1 තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය හෝ පාඨවලට සවන් දී අර්ථ අවබෝධ කරගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 20

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨවලට සවන් දී සරල අවබෝධයක් ලබාගෙන ලියා දක්වයි. ප්‍රකාශ කරයි.
- සරල අර්ථ හා පදගතාර්ථ පිළිබඳ දැනුමක් ලබාගෙන ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ශ්‍රවණය වූ කලී භාෂාවබෝධය සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ගයකි. එය ඉටු කරගැනීමට අදාළ ග්‍රන්ථයන්ගෙන් ඵලදායී සදුපදේශ අන්තර්ගත ශ්‍රවණප්‍රිය භාෂා ව්‍යවහාර සහිත පාඨ තේරුම් ගැනීම සුදුසු ය. එහි දී ගුරුවරයා විසින් නිවැරැදි උච්චාරණය සහිත ව සංස්කෘත පාඨ කියවනු ලැබීමට යෝග්‍ය ශ්‍රව්‍ය-දෘශ්‍ය තැටි භාවිත කිරීම වැදගත් ය. හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර, කථාසරිත්සාගර යන ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් සවන් දීමට සලස්වන්න.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- උපදේශාත්මක ගද්‍ය හා පද්‍ය කොටස් ඇතුළත් අදාළ ග්‍රන්ථ පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- උද්ධෘත ගද්‍ය පද්‍ය කොටස් හඬ නගා උච්චාරණ කර පෙන්වන්න.
- සාමූහික ව සිසුන්ට ඒවා කියවීමට අවස්ථාව සලසා දෙන්න.
- අර්ථාවබෝධයට ව්‍යාකරණ පිළිබඳ ඇති අවබෝධයේ වටිනාකම වටහා දෙන්න.
- සවන් දීමේ ඇති වැදගත්කම පිළිබඳ සමාලෝචනයක් කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සවන් දීමේ ඇති වැදගත්කම ප්‍රකාශ කරයි.
- උද්‍යෝගයෙන් සවන් දෙයි.
- සවන් දීම මඟින් ගද්‍ය පද්‍ය පාඨවල අර්ථය වටහාගෙන ලියයි.
- සවන් දුන් උපදේශ හා ප්‍රබන්ධ කොටස් ජීවිතාලෝකයට මහෝපකාරී වන බව අවබෝධ කරගෙන හැසිරෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ.
- උද්ධෘත ගද්‍ය පද්‍ය කොටස්.
- අන්තර්ජාලයෙන් තෝරාගත් ආකර්ෂණීය ගායනා හා ගද්‍යමය හඬපට.

**වැඩි දුර ගවේෂණය**

- උපදේශාත්මක හා හරවත් ශ්‍රව්‍ය දෘශ්‍ය කොටස් භාවිතයට යොමු කරවීම
- අන්තර්ජාලය.

## 23. ඒකකය - සවන් දී නිවැරැදි ව ප්‍රතිචාර දැක්වීම

**7.0 නිපුණතාව**

සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරැදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම**

7.2 තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය හෝ පාඨවලට සවන් දී නිවැරැදි ව ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 20

**ඉගැනුම් පල**

- සංස්කෘත පාඨවලට සවන් දී අර්ථය අවබෝධ කරගෙන විස්තර කරයි.
- ගද්‍ය පද්‍ය පාඨ ඇසුරින් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමේ හැකියාව ලබයි.
- සංස්කෘත ගද්‍ය පද්‍ය පාඨ සාමූහික ව හා කේවල ව සජ්ඣායනා කරයි.
- මනා ශ්‍රවණය පහසුවෙන් පිළිතුරු දීමට මහත් රුකුලක් බව වටහාගනියි.
- වැදගත් සැම දෙයකටම හොඳින් සවන් දීමේ ආකල්ප ඇති කරගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සරල පාඨ මෙන් ම යම් ප්‍රමාණයකට සන්ධි හා සමාස ආදි ව්‍යාකරණාංග ද ඇතුළත් පාඨ තෝරාගන්න. අදාළ පාඨයන්හි සන්ධි-විසන්ධි, ආඛ්‍යාත, නිරුක්ති බඳු මෙතෙක් උගත් පාඨයන්හි ඇතුළත් ව්‍යාකරණාංග පැහැදිලි කරන්න. නිපුණතා මට්ටමට අදාළ හැකියාව සිසුන් තුළ ගොඩනගන්න.

**යෝජිත ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර, කථාසරිත්සාගර යන ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් උපයෝගී කරගන්න.
- උද්ධෘත ගද්‍ය පද්‍ය කොටස් හඬනගා උච්චාරණය කර පෙන්වන්න.
- සිසුන්ටත් ඒවා කියවීමට අවස්ථාව සලසා දෙන්න.
- ප්‍රකාශිත කොටස්වලින් සරල ප්‍රශ්න විමසන්න.
- ව්‍යාකරණමය කොටස් සහිත පාඨ පහසුවෙන් අවබෝධ කරගැනීමට මඟ පෙන්වන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සාවධාන ව අසා සිට පිළිතුරු දෙයි.
- සංස්කෘත උද්ධෘත පාඨ හඬනගා නිවැරදි ව කියවයි.
- සංස්කෘත උද්ධෘත පාඨවල තේරුම කියයි; ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- උද්ධෘත ප්‍රශ්නෝත්තර කොටස්වල ඡායා පිටපත්.
- අන්තර්ජාලයෙන් තෝරාගත් උපදේශාත්මක ශ්‍රව්‍ය දෘශ්‍ය කොටස්.

**වැඩිදුර ගවේෂණය**

- උපදේශාත්මක හා හරවත් ශ්‍රව්‍ය දෘශ්‍ය කොටස් භාවිතයට යොමු කරවීම.

## 24. ඒකකය - ආගමික පරිසරය

**8.0 නිපුණතාව**

අදාළ සංස්කෘතික පරිසරය හඳුනාගනියි.

**නිපුණතා මට්ටම**

8.1 ආගමික පරිසරය හඳුනාගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 15

**ඉගෙනුම් පල**

- අදාළ සංස්කෘත සාහිත්‍ය කෘතිවලින් පිළිබිඹු වන සමකාලීන ආගමික හා සංස්කෘතික පරිසරය හඳුනා ගෙන කියයි; ලියයි.
- ආගමික ජීවිතය හා ස්වාභාවික පරිසරය අතර ඇති අවියෝජනීය සම්බන්ධතාව පිළිබඳ ව කථාවක් පවත්වයි. ව්‍යාපෘතියක් හෝ නිබන්ධනයක් හෝ සකස් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

මහාභාරත, රාමායණ, කඨෝපනිෂද් ඇසුරින් වීරකාව්‍ය හා උපනිෂත් සාහිත්‍යය පිළිබඳ සරල දැනුමක් ලබාදෙන්න. අදාළ සාහිත්‍ය කෘතිවල කර්තෘ කාලය අන්තර්ගතය හා සුවිශේෂතා හඳුන්වාදෙන්න. එහි දී මහාභාරතයේ ප්‍රකට වන ආගමික ඉගැන්වීම් ප්‍රධාන වශයෙන් ශ්‍රී කෘෂ්ණදේව සංකල්පය හා බැඳෙන බව පෙන්වාදෙන්න.

උදාහරණ : පරිත්‍රාණාය සාධූනාං- විනාශාය ච දුෂ්කෘතාං,
ධර්ම සංස්ථාපනාර්ථාය- සංභවාමි යුගේ යුගේ.

යදා යදා හි ධර්මස්‍ය-ග්ලානිර් භවති භාරත,
අභ්‍යුත්ථානමධර්මස්‍ය-තදාත්මානං සෘජාම්‍යහම්.

ඊක්ෂතේ යෝගයුක්තාත්මා-සර්වත්‍ර සමදර්ශිනඃ.

රාමායණයෙහි ආගමික ඉගැන්වීම් ප්‍රධාන වශයෙන් වෛෂ්ණව ආගමේ ප්‍රකට වීමකි. එසේ ම හින්දු ආගමික සම්ප්‍රදායයේ ම තවත් ප්‍රකට වීමක් වන ශෛවාගමික ලක්ෂණ ද මෙහි අන්තර්ගත ව ඇති බව පෙන්වා දෙන්න. උපනිෂදයන්හි ප්‍රධාන ඉගැන්වීමක් වන්නේ තමා ලෝකය වෙතින් ද ලෝකය තමා වෙතින් ද වෙන් කළ නොහැකි බව යන්න පැහැදිලි කර දෙන්න.

උදාහරණ : තත් ත්වමසි, සර්වං ඛලු ඉදං බ්‍රහ්ම

අහං බ්‍රහ්මාස්මි ත්වං ලෝක ඉති

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- අදාළ සාහිත්‍ය ග්‍රන්ථයන්ගෙන් ප්‍රකට වන ඒ ඒ ආගමික සංකල්ප ගැන කෙටි අවබෝධයක් ලබා දෙන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් වශයෙන් බෙදා විවිධ ආගමික සංකල්ප පිළිබඳ තොරතුරු රැස් කිරීමට මඟ පෙන්වන්න.
- අධීත ආගමික සංකල්ප ද උපයෝගි කරගනිමින් ශිෂ්‍යයා කැමති ආගමික සිද්ධස්ථානයක් පිළිබඳ ව වාර්තාවක් සැකසීමට යොමු කරන්න.
- සොබාදහම සහ මිනිසා අතර පවතින අවියෝජනීය සම්බන්ධය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- අදාළ ග්‍රන්ථයන්ගෙන් ප්‍රකට වන ඒ ඒ ආගමික සංකල්ප පෙන්වා දෙයි.

- අධීත ආගමික සංකල්ප උපයෝගි කරගනිමින් ආගමික සිද්ධස්ථානයන් පිළිබඳ ව වාර්තා සකසයි.
- සොබාදහම හා මිනිසා අතර පවතින අවියෝජනීය සම්බන්ධතාව පිළිබඳ කථාවක් කරයි; රචනයක් ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- අදාළ සාහිත්‍ය ග්‍රන්ථවලින් ආගමික සංකල්ප ඉස්මතු වන අවස්ථා දැක්වෙන සටහනක්

**වැඩි දුර ගවේෂණය** :-

- වෛදික සාහිත්‍යය, තිලකසිරි, ජේ.ඃ ගොඩගේ, 1998.
- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, තිලකසිරි, ජේ.ඃ ගොඩගේ, 1999.

# 25. ඒකකය - අධ්‍යාපනික පසුබිම

**8.0 නිපුණතාව**

අදාළ සංස්කෘතික පරිසරය හඳුනාගනියි.

**නිපුණතා මට්ටම**

8.2 ආධ්‍යාපනික පසුබිම හඳුනාගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 15

**ඉගෙනුම් පල**

- වීරකාව්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන ආධ්‍යාපනික සංකල්ප මතු කොට ප්‍රකාශ කරයි.
- උපනිෂද් අධ්‍යාපනයෙහි ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- තද් අධ්‍යයන සම්ප්‍රදාය අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

අදාළ සාහිත්‍ය කෘතිවලින් (මහාභාරත, රාමායණ, කඨෝපනිෂද් ඇසුරින් වීරකාව්‍ය හා උපනිෂත් සාහිත්‍යය පිළිබඳ සරල දැනුමක් ලබා දෙන්න) ප්‍රකට වන අධ්‍යාපන සංකල්ප, විෂය කරුණුවලින් මෙන් ම ආධ්‍යාත්මික වශයෙන් ද ශිෂ්‍යයා පෝෂණය කරන බවත්, අතීතයට මෙන් ම වර්තමානයට ද එක සේ ගළපා ගත හැකි ඉගැන්වීම් මාලාවක් බවත් පෙන්වා දෙන්න.

- ඒ සඳහා බ්‍රාහ්මණ ඍෂිවරයාගේ ගුරු භූමිකාව පැහැදිලි කරන්න.
- වීරකාව්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන ගුරු-ශිෂ්‍ය සම්බන්ධය මහාභාරතයේ ද්‍රෝණ කෘප චරිත ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
- උපනිෂද් අධ්‍යාපන ක්‍රමයේ විශේෂතා, ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සමීප බව, සහජීවනය, ශිෂ්‍යයාගේ බ්‍රහ්මචාරී ජීවන ක්‍රමය, අන් සියලු විෂයයන්ට වඩා ආත්මවිද්‍යාව එනම් ජීවිතාවබෝධය පිළිබඳ අවධාරණය කිරීම පැහැදිලි කර දෙන්න.
- උපනිෂද් ගුරු-ශිෂ්‍ය ප්‍රාර්ථනයඃ සහ නාවවතු සහ නෞ භුනක්තු සහ වීර්යං කරවාවහෛ තේජස්වී නාවධීතමස්තු මා විද්විෂාවහෛ. ඕම් ශාන්තිඃ ශාන්තිඃ ශාන්තිඃ! (හේ අප දෙදෙන රකීවා! එකට විඳීවා! අපි දෙදෙන එකට උත්සාහ කරම්වා ! අප ඉගෙනගත් දෙය තෙදවත් වේවා! අපි දෙදෙනා එකිනෙකාට ද්වේෂ නොකරම්වා ! ඕම් ශාන්ති ශාන්ති ශාන්ති!)
- ගුරුවරයා සහ ශිෂ්‍යයා යන දෙදෙනා ම ජීවිතයේ යථාර්ථය පිළිබඳ එක ම ඉගැන්වීමේ යෙදෙන බවත්, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීමට ප්‍රමුඛතාව ලබා දෙන මෙන් පෙන්වා දෙන්න.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදා වීරකාව්‍ය සමාජයේ අධ්‍යාපන ක්‍රමය හා උපනිෂද් සමාජයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ කරුණු සෙවීමට යොමු කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදා අධීත අධ්‍යාපන සංකල්ප සහ නූතන අධ්‍යාපන සංකල්ප යන මාතෘකා දෙක යටතේ ශිෂ්‍ය මූලික සංකථනයක් කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- වීරකාව්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන ආධ්‍යාපනික සංකල්ප යන මැයෙන් ලිපියක් ලියයි. කතාවක් පවත්වයි.
- උපනිෂද් අධ්‍යාපන ක්‍රමයේ විශේෂතා ගොනු කරයි.
- අධීත අධ්‍යාපන සංකල්ප හා නූතන අධ්‍යාපන සංකල්ප අතර සම විෂමතා පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- උද්දාලක - ආරුණේය සංවාදය ඇතුළත් සටහනක්.

**වැඩි දුර ගවේෂණය :**

- කඨෝපනිෂද් (හැඳින්වීම) පරි: සුමන ලාල් කැකුලාවල, කොළඹ, 1961
- ක්‍රිෂ්ණ මූර්ති සහ භාරතීය දර්ශනය, (දෙවැනි පරිච්ඡේදය) රණසිංහ, සමන් චන්ද්‍රඃ නුගේගොඩ 1998
- රාමායණ යාත්‍රා - සමන් චන්ද්‍ර රණසිංහ, නුගේගොඩ, 2004.
- සාවිත්‍රී (සාවිත්‍ර්‍යුපාඛ්‍යානය) පරි. පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, නුගේගොඩ, 1999

## 26. ඒකකය - නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය

**9.0 නිපුණතාව**

නිර්දිෂ්ට පාඨ හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම**

9.1 සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට නිවැරදි අර්ථය ලැබෙන සේ පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 20

**ඉගැනුම් පල**

- නිර්දිෂ්ට පාඨ හා අනිර්දිෂ්ට පාඨ සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට නිවැරදි ව ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කරයි.
- උපුටා දක්වන පදවලට එතෙක් අවබෝධ කරගත් ව්‍යාකරණ රීතිවලට අනුකූල ව ව්‍යාකරණ සටහන් සපයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

භාෂාවේ ප්‍රවීණත්වය මැනීමේ මිණුම් දණ්ඩක් ලෙස පරිවර්තන ශක්‍යතාව පෙන්වාදිය හැකි ය. ශිෂ්‍යයාගේ පරිවර්තන කෞශල්‍ය වර්ධනයේ දී පළමු ව කළ යුත්තේ ඔහු විසින් ඉගෙනගනු ලබන භාෂාව මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීම යි. පරිවර්තනය යන වචනයෙහි තේරුම මුළුමනින් ම පෙරළීම යි. (පරි+√වෘත් - පරිවර්තනෙ) ඒ අනුව පරිවර්තනය යනු කිසියම් භාෂාවක ඇති වචනවලට සමාන වෙනත් වචන දීම පමණක් නො වේ. පරිවර්තනය කළ යුත්තේ ඒ භාෂාව අයත් වන සංස්කෘතික පරිසරය ද ඉස්මතු වන ආකාරයට යි.

සරල සංස්කෘත වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරමින් උක්තානුක්ත සම්බන්ධතාව අවබෝධ කරගැනීමට මඟ පෑදීම; (මේ සඳහා බාලාදර්ශ, ප්‍රථමාදර්ශ ආදි කෘතියකින් තෝරාගත් සරල වාක්‍ය කිහිපයක් නිදසුන් වශයෙන් පරිවර්තනය කර පෙන්වීම සහ එබඳු ම සරල වාක්‍ය කිහිපයක් පරිවර්තනය කිරීම සඳහා අභ්‍යාස වශයෙන් දීම කළ හැකි ය. උදාහරණ වාක්‍ය තෝරාගැනීමේ දී එතෙක් හදාරා ඇති ව්‍යාකරණාංගවලට ප්‍රමුඛතාව ලැබෙන පරිදි තෝරාගැනීම සප්‍රයෝජන වනු ඇත.)

බාලාදර්ශ, සුරභාරතී, ප්‍රථමාදර්ශ, සංස්කෘත ශික්ෂකය (එම්.එච්.එෆ් ජයසූරිය) සරල සංස්කෘත ශික්ෂකය (බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමි) සංස්කෘත ප්‍රථම පුස්තකය (ආර්.ජී. භාණ්ඩාර්කර්)

सारथिः रथं नयति । = රියදුරා රථය ගෙනයයි.

कपयः फलानि खादन्ति । = වඳුරෝ ගෙඩි කති.

आवां शकटेन गृहं गच्छावः । = අපි දෙදෙන කරත්තයෙන් ගෙදර යමු.

සන්ධි සහිත වාක්‍ය විශ්ලේෂණය කරමින් වාක්‍ය රටා අවබෝධ කරගැනීමට අවශ්‍ය මඟ පෑදීම.

कुक्कुटाः प्रत्यहं प्रातरस्तरां प्रबुध्यन्ते । [ प्रति + अहं , प्रातः + तरां ] =
කුකුළෝ දිනපතා උදෑසන ම අවදි වෙති,

कुक्कुटानां शब्दं श्रुत्वाकेचिज्जनाः शयनादुत्थाय स्वीयेषु कर्मसु प्रवर्तनते ।

[ केचित् + जनाः , शयनात् + उत्थाय ] =

කුකුළන්ගේ ශබ්දය අසා ඇතැම් ජනයෝ යහනින් නැඟිට සිය කටයුතුවල නිරත වෙති.

धनिकाः ग्रामान्नगरं गच्छन्ति । [ ग्रामात् + नगरं ] =

ධනවත්තු ගමෙන් නගරයට යති.

සන්ධි, සමාස, නාම විශේෂණ සහ ක්‍රියා විශේෂණ සහිත සංකීර්ණ වාක්‍යයක උක්තාඛ්‍යාත පද සම්බන්ධය අවබෝධ කරගැනීමට මඟ පෑදීම.

आसीदयोध्यायां सूर्यवंशीयः धर्मात्मा शूरः सगरो नाम महाराजः, यः खलु सागराम्भरां विश्वम्भरां प्रीत्या शासन् प्रजानामनुरागस्य पात्रतामगमत्।

සරල සංස්කෘත පද්‍යවල සහ සංකීර්ණ සංස්කෘත පද්‍යවල උක්තාඛ්‍යාත පද සම්බන්ධය ග්‍රහණය කරගනිමින් පරිවර්තනය කිරීමේ හැකියාව. (මේ සඳහා තෝරාගත් පද්‍යයක උක්තාඛ්‍යාත පද සම්බන්ධය අනුව යමින් සිසුන් සමඟ එක් ව අන්වය සකස් කිරීම සප්‍රයෝජන වනු ඇත.)

परोपकाराय फलन्ति वृक्षाः पारेपकाराय वहन्ति नद्यः।
परोपकाराय दुहन्ति गावः परोपकारार्थमिदं शरीरम्॥

[අන්වය:- वृक्षाः परोपकाराय फलन्ति। नद्यः पारेपकाराय वहन्ति।
गावः परोपकाराय दुहन्ति। इदम् शरीरम् परोपकारार्थम्॥]

මාධ්‍ය භාෂාවේ ව්‍යාකරණ රීතීන් හා සම්ප්‍රදායයන් උල්ලංඝනය නොවන පරිදි පරිවර්තනය කිරීමේ හැකියාව ලබාගැනීම.

**යෝජිත ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- පරිවර්තනය සඳහා සුදුසු පාඨ පහක් තෝරාගෙන ශිෂ්‍යයන් පරිවර්තන කාර්යයෙහි යොදවන්න.
- පරිවර්තනය සඳහා සුදුසු පාඨ කීපයක් තෝරාගැනීමට ශිෂ්‍යයනට අවස්ථාව ලබාදෙන්න. එම පාඨ පරිවර්තනයෙහි ලා ද ශිෂ්‍යයන් යොමු කරවන්න.
- පරිවර්තන ඉදිරිපත් කිරීමට ඒ ඒ කණ්ඩායම්වලට අවස්ථාව ලබාදෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨවල බැඳි අකුරු නිවැරැදි ව උච්චාරණය කරයි.
- එබඳු ගද්‍ය පද්‍ය පාඨ වෙනත් කෘතිවලින් සොයා ලියයි; ශ්ලෝක ගායනා කරයි.
- නිර්දිෂ්ට පාඨ හා අනිර්දිෂ්ට පාඨ සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට නිවැරැදි ව ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කරයි.
- උපුටා දක්වන පදවලට එතෙක් අවබෝධ කරගත් ව්‍යාකරණ රීතිවලට අනුකූල ව ව්‍යාකරණ සටහන් ලියයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ දෛනික ව්‍යවහාරය සඳහා භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ
- රූප සටහන්, වගු, වෙනත් පාඨ්‍ය ග්‍රන්ථ.
- විභාග ප්‍රශ්නපත්‍ර.
- අන්තර්ජාල පහසුකම්.

වැඩි දුර ගවේෂණය

- සංස්කෘත ශික්ෂකය 1,2, 3, පූජ්‍ය ආනන්දමෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.: නුගේගොඩ, 2002.
- සංස්කෘත බාලාදර්ශ, ශාස්ත්‍රී, කේ. එල්. වී.: එාල්සාට්, 2004.

## 27. ඒකකය - මාධ්‍ය භාෂාගත නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය

**9.0 නිපුණතාව**

නිර්දිෂ්ට පාඨ හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම**

9.2 මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 20

**ඉගෙනුම් පල**

- මාධ්‍ය භාෂාවෙන් දෙනු ලබන වාක්‍ය හා ඡේද නිවැරැදි ව සංස්කෘත භාෂාවට පරිවර්තනය කරයි.
- සංස්කෘතයට ආවේණික භාෂා ප්‍රයෝග භාවිත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ශිෂ්‍යයාගේ භාෂා ප්‍රවීණත්වය මැනීමේ උරගල වන්නේ මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට නැඟීම යි. යථෝක්ත අරමුණු සාධනය උදෙසා ශිෂ්‍යයන් ලවා හැකි තාක් ඊට අදාළ අභ්‍යාස කරවිය යුතු වේ. මාධ්‍ය භාෂාවෙන් ඇති සරල වාක්‍ය සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම, මාධ්‍ය භාෂාවෙන් ඇති සංකීර්ණ වාක්‍යයක උක්තාඛ්‍යාත සම්බන්ධය, නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ හඳුනාගෙන සංස්කෘත ව්‍යාකරණ රීතීන් උල්ලංඝනය නොවන පරිදි සංස්කෘතයට පරිවර්තනය කිරීම. සංස්කෘතයෙහි ප්‍රචලිත සදුක්ති කිහිපයක් තෝරාගෙන ඒවා මාධ්‍ය භාෂාවට පරිවර්තනය කොට, ශිෂ්‍යයනට ලබා දී එම පරිවර්තිත පාඨ සංස්කෘතයට නැඟීමට සැලැස්වීම.

උදාහරණ

රුක්හු තුමූ අව්වේ සිටිති. අනෙකකුට සෙවන සලසති.
(ඡායාමන්‍යස්‍ය කුර්වන්ති තිෂ්ඨන්ති ස්වයමාතපේ)

සමඟිය පුරුෂයනට උතුම් ය.
(සංහතිඃ ශ්‍රෙයසී පුංසාම්)

සරල ගද්‍ය පද්‍ය පාඨ ඇසුරින් තෝරාගත් වාක්‍ය හා මාධ්‍ය භාෂාවෙන් නිර්මාණය කරගත් සරල වාක්‍ය සහිත ඡේද.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- මාධ්‍ය භාෂාවෙන් සරල වාක්‍ය 10ක් ශිෂ්‍යයා ලවා නිර්මාණය කරවන්න.
- මාධ්‍ය භාෂාවෙන් සංකීර්ණ වාක්‍ය 10ක් ද ශිෂ්‍යයා ලවා නිර්මාණය කරවන්න.
- ශිෂ්‍යනිර්මිත තද්වාක්‍ය ඔවුන් ලවා ම සංස්කෘතයට නැඟීමට සලසන්න.
- කණ්ඩායම් වශයෙන් පරිවර්තිත පාඨ ඉදිරිපත් කරන්න.
- ගුණදොස් සාකච්ඡා කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- මාධ්‍ය භාෂාවෙන් දෙනු ලබන වාක්‍ය හා ඡේද නිවැරැදි ව සංස්කෘත භාෂාවට පරිවර්තනය කරයි.
- සංස්කෘතයට ආවේණික භාෂා ප්‍රයෝග ලැයිස්තු ගත කරයි.
- උපුටා දක්වන පදවලට එතෙක් අවබෝධ කරගත් ව්‍යාකරණ රීතිවලට අනුකූල ව ව්‍යාකරණ සටහන් ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ.
- රූප සටහන්, වගු, වෙනත් පාඨ්‍ය ග්‍රන්ථ.
- විභාග ප්‍රශ්නපත්‍ර.
- අන්තර්ජාල පහසුකම්.

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත ශික්ෂකය 1,2, 3, පූජ්‍ය ආනන්දමෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.: නුගේගොඩ, 2002.
- සංස්කෘත බාලාදර්ශ, ශාස්ත්‍රී, කේ. එල්. වී.: එාල්සාට්, 2004.

## 28. ඒකකය - වෛදික සාහිත්‍යය

**10.0 නිපුණතාව**

සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබාගනියි.

**නිපුණතා මට්ටම**

10.1 වෛදික සාහිත්‍යය පිළිබඳ ව සරල අවබෝධයක් ලබාගනියි.

**කාලච්ඡේද 06**

**ඉගෙනුම් පල**

- වෛදික සාහිත්‍යය පිළිබඳ විස්තර කරයි.
- චතුර්වේදය හා බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂත්, පුරාණ යන කෘති හඳුනාගනියි.
- ඒවායේ අන්තර්ගත විෂය සැකෙවින් ඉදිරිපත් කිරීමට සමත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

චතුර්වේදය හා බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂත්, පුරාණ යන ග්‍රන්ථ පිළිබඳ ව සරල දැනුමක් ලබාදිය යුතු ය. අතීත භාරතීයන්ගේ ආගමික හා සාමාජික ජීවිතය හඳුනාගැනීමෙහි ලා වෛදික සාහිත්‍යාවබෝධය අත්‍යවශ්‍ය ය. එම නිසා ඍග්වේදයේ අන්තර්ගතය සැකෙවින් සාකච්ඡා කොට, යජුර්වේදය කෘෂ්ණ, ශුක්ල වශයෙන් දෙවැදෑරුම් බව පෙන්වා දී එහි අන්තර්ගතය සැකෙවින් හඳුන්වා දෙන්න. අනතුරු ව සාමවේදය අතීත භාරතීයයන්ගේ ඥානය ප්‍රකට කරන ග්‍රන්ථයක් බවත් එමෙන් ම අථර්වවේදය ශුභදායී මෙන් ම අශුභදායී මන්ත්‍ර ද, භෛෂජ්‍ය සූත්‍ර ද ඇතුළත්, ජනතාවට වඩාත් සමීප වේදයක් බවත් හඳුන්වා දෙන්න. අවසානයේ දී බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂත් සහ පුරාණ ග්‍රන්ථ හඳුන්වා දෙන්න.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- චතුර්වේදය නම් කොට ඒවායේ අන්තර්ගත කරුණු කෙටියෙන් සමාලෝචනය කරන්න.
- බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් හා පුරාණ ග්‍රන්ථ පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් 4කට බෙදා චතුර්වේදය, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් හා පුරාණ පිළිබඳ යම් අවබෝධයක් ඇති වන අන්දමේ වාර්තා 4ක් පිළියෙළ කරන්න.

**තක්සේරුව හා ඇගයීම**

- පැරණිතම සාහිත්‍යය වෛදික සාහිත්‍යය බව පෙන්වා දෙයි.
- වේද ග්‍රන්ථවල වැදගත්කම ප්‍රකාශ කරයි.
- බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් හා පුරාණ ග්‍රන්ථ කියවීමට කැමැත්ත පළ කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- චතුර්වේද පාඨ හා කතා ඇතුළත් දෘශ්‍ය සංයුක්ත තැටි.

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත සාහිත්‍යය, සේනානායක, ජී. එස්. බී .: ගොඩගේ.
- වෛදික සාහිත්‍යය, තිලකසිරි, ජේ.: ගොඩගේ, 1998.
- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, තිලකසිරි, ජේ.: ගොඩගේ, 1999.

## 29. ඒකකය - වීරකාව්‍ය සාහිත්‍යය

**10.0 නිපුණතාව**

සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබාගනියි.

**නිපුණතා මට්ටම**

10.2 වීරකාව්‍ය සාහිත්‍යය හඳුනාගනියි.

**කාලච්ඡේද 05**

**ඉගෙනුම් පල**

- රාමායණ හා මහාභාරත යන කෘති හා ඒවායේ කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ ව සැකෙවින් පැහැදිලි කරයි.
- සංස්කෘත සාහිත්‍යයේ ඒවාට හිමි ස්ථානය පිළිබඳ හැඳින්වීම් කිරීමට සමත් වෙයි.
- වීරකාව්‍යවල ඇති සාහිත්‍යාත්මක වටිනාකම අවබෝධ කරගෙන විස්තර කරයි.
- ඓතිහාසික කතා පුවත් දෙක ම සොයා කියවීමට කැමති වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

වීරකාව්‍ය කෘතිවල කර්තෘ, කාලය, අන්තර්ගතය හා සුවිශේෂතා කෙටියෙන් පැහැදිලි කරන්න. ලෞකික සංස්කෘත සාහිත්‍යයේ සමාරම්භය සටහන් වන්නේ රාමායණයෙනි. රාමායණය හා මහාභාරතය පිළිබඳ අවබෝධයක් ලබාදීම අත්‍යවශ්‍ය වේ. රාමායණයේ කර්තෘ වාල්මීකි, කාණ්ඩ 7, (බාල ආදි) ශ්ලෝක 24000, ලෝකයේ ප්‍රමාණයෙන් දෙවැනි විශාලතම වීරකාව්‍යය බව හැඳිනගැනීම හා මහාභාරතය (සාම්ප්‍රදායික ව කර්තෘත්වය වේදව්‍යාස වෙත පැවරේ) පර්ව 18කි, (19 පර්වය වන්නේ හරිවංශය යි), ශ්ලෝක ලක්ෂයකි. එමෙන් ම ලෝකයේ දීර්ඝතම වීරකාව්‍යය යි.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- වීරකාව්‍ය යනු කුමක් දැයි විස්තර කරන්න.
- රාමායණ කථාව ශිෂ්‍යයනට සැකෙවින් කියා දෙන්න.
- මහාභාරත කථාව ශිෂ්‍යයනට සැකෙවින් කියා දෙන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදා රාමායණ, මහාභාරත ගැන ප්‍රමාණවත් වාර්තා දෙකක් පිළියෙළ කරන්න.

**තක්සේරුව හා ඇගයීම**

- වීරකාව්‍ය යනු කුමක් දැයි විස්තර කරයි.
- රාමායණය හා මහාභාරතයේ සංඥා ආදි අර්ථපඤ්චකය ලියයි.
- වීරකාව්‍ය සාහිත්‍යයේ වටිනාකම අවබෝධ කරගෙන විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- කුරු - පාණ්ඩව යුද්ධය හා රාමායණ කතා පුවත ඇතුළත් දෘශ්‍ය සංයුක්ත තැටි.

**වැඩි දුර ගවේෂණය**

- වාල්මීකි රාමායණය, අනුඃ ඩබ්. ඒ. සිල්වා, මාතර, 1961
- රාමායාණයාත්‍රා, පරිඃ සමන් චන්ද්‍ර රණසිංහ, නුගේගොඩ, 2000
- මහාභාරතාඛ්‍යානය, අභයසිංහ, පී. ඇම්. පී.ඃකොළඹ, 1963
- ශ්‍රීමත් වාල්මීකිගේ රාමායණය, 1, 2, 3 අනුවාදය ජී. එස්. බී. සේනානායක, කොළඹ, 1999,

## 30. ඒකකය - සංස්කෘත මහාකාව්‍ය

**10.0 නිපුණතාව**

සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබාගනියි.

**නිපුණතා මට්ටම**

10.3 සංස්කෘත මහාකාව්‍ය ලක්‍ෂණ හඳුනාගනියි.

10.4 සංස්කෘත මහාකාව්‍ය හඳුනාගෙන විස්තර කරයි.

**කාලච්ඡේද :** 11

**ඉගෙනුම් පල**

- මහාකාව්‍යයක් යනු කුමක් දැයි විස්තර කිරීමේ හැකියාව ලබයි.
- මහාකාව්‍ය ආකෘතිය නිදසුන් සහිත ව හැඳින්වීමට සමත් වෙයි.
- මහාකාව්‍ය ලක්ෂණ ලියා දක්වයි.
- මහාකාව්‍ය ලක්ෂණ දැක්වෙන ශ්ලෝක මතකයෙන් කියයි.
- මහාකාව්‍ය කෘති හඳුනාගැනීමට සමත් වෙයි.
- සංස්කෘත මහාකාව්‍ය කෘති සඳහා උදාහරණ ලියා දක්වයි.
- සංස්කෘත මහාකාව්‍ය කෘතිවල කර්තෘ කාල ආදි තොරතුරු ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත මහාකාව්‍ය ලක්‍ෂණ හඳුන්වා දෙන්න. සිංහල මහාකාව්‍ය කෙරෙහි ද ආකෘතිය හා වස්තු විෂය අතින් බලපෑ සංස්කෘත මහාකාව්‍ය පිළිබඳ මූලික අවබෝධයක් ලබාගැනීම සංස්කෘත විද්‍යාර්ථීනට අත්‍යවශ්‍ය ය. මෙහි දී සංස්කෘත මහාකාව්‍ය ලක්‍ෂණ පිළිබඳ සරල අවබෝධයක් ශිෂ්‍යයා තුළ ඇති කිරීම අපේක්ෂා කෙරේ.

අශ්වඝෝෂගේ සිට ශ්‍රී හර්ෂ (නාට්‍යකාරක ශ්‍රී හර්ෂ නොවේ) තෙක් වන සංස්කෘත මහාකවීන් හා ඔවුන්ගේ කෘති පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මවාගැනීමට හැකි පරිදි කරුණු පෙළ ගස්වන්න. අශ්වඝෝෂ හිමියන් සහ ඒ හිමියන්ගේ බුද්ධචරිත සහ සෞන්දරානන්ද මහාකාව්‍ය හඳුන්වා දෙන්න කාලිදාස ගේ කෘතීන්හි සුවිශේෂ පද්‍ය කිහිපයක් උපුටා-දක්වන්න.

උදාහරණ ඃ-

සංචාරිණී දීපශිඛෙව රාත්‍රෞ<br>
යං යං ව්‍යතීයාය පතිංවරා සා,<br>
නාරන්ද්‍රමාර්ගාට්ට ඉව ප්‍රපෙදෙ<br>
විවර්ණභාවං ස ස භූමිපාලඃ

- රඝුවංශ 6.67

පත්තිඃ පදාතිං රථිනං රථේශස්තුරංගසාදී තුරගාධිරූඪම්,<br>
යන්තා ගජස්‍යාභ්‍යපතද්ගජස්ථං තුල්‍යප්‍රතිද්වන්ද්වි බභූව යුද්ධම්.

- රඝුවංශ 7.37

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- මහාකාව්‍යයක් යනු කුමක් දැයි විස්තර කර දෙන්න.
- සංස්කෘත මහාකාව්‍ය ලක්‍ෂණ පැහැදිලි කරදෙන්න.
- සංස්කෘත ශ්ලෝක ඇසුරින් මහාකාව්‍ය ලක්‍ෂණ ධාරණය කරගැනීමට මඟ පෙන්වන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කීපයකට බෙදා සංස්කෘත මහාකාව්‍ය ලක්‍ෂණ කොටස් වශයෙන් වෙන වෙන ම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කීපයකට බෙදා මහාකවීන් ගැන තොරතුරු රැස් කරවන්න.
- මහාකාව්‍ය නිර්මාණයන්ගෙන් ජීවිතයට සමීප උද්ධෘත ගෙන ශිෂ්‍යයනට ලබාදෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- මහාකාව්‍යයක් යනු කුමක් දැයි විස්තර කරයි.
- මහාකාව්‍ය ආකෘතිය නිදසුන් සහිත ව හඳුන්වයි.
- මහාකාව්‍ය ලක්ෂණ කියයි.
- මහාකාව්‍යවල ඇති සාහිත්‍යාත්මක බව අවබෝධ කරගනියි.
- අරුත් කියවීමට හා අවබෝධ කරගැනීමට කැමැත්ත පළ කරයි.
- මහාකාව්‍ය කෘති සඳහා උදාහරණ දක්වයි.
- මහාකාව්‍යවල ඇති සාහිත්‍යාත්මක බව අවබෝධ කරගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- මහාකාව්‍ය ලක්ෂණ ගොනු කළ ලේඛනයක්.
- සංස්කෘත මහාකාව්‍ය කෘති කීපයක්.
- නිර්දිෂ්ට ග්‍රන්ථ.

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත සාහිත්‍යය, සේනානායක, ජී. එස්. බී.: , කොළඹ, 1960.
- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, තිලකසිරි, ජයදේව.: කොළඹ, 1961,

# 31. ඒකකය - සංස්කෘත ඛණ්ඩකාව්‍ය

**10.0 නිපුණතාව**

සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

10.5 සංස්කෘත ඛණ්ඩකාව්‍ය හඳුනාගනියි.

**කාලච්ඡේද :** 08

**ඉගෙනුම් පල**

- ඛණ්ඩකාව්‍යයක් යනු කුමක් දැයි විස්තර කිරීමේ හැකියාව ලබයි.
- සංස්කෘත ඛණ්ඩකාව්‍යවල ලක්‍ෂණ හඳුනාගනියි.
- ඛණ්ඩකාව්‍ය හා ඒවායේ අන්තර්ගතය හැඳින්වීමට සමත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ඛණ්ඩ කාව්‍ය හා මහා කාව්‍ය අතර වෙනස්කම් පැහැදිලි කළ යුතු වේ. ඛණ්ඩකාව්‍ය සංස්කෘත සාහිත්‍යය පිළිබඳ මහත් අභිරුචියක් ඇති කරවන සාහිත්‍යාංගයකි. ශිෂ්‍යයා ගේ වින්දන මට්ටමේ දියුණුවට ද අතිශය උපකාරී ය. ඍතුසංහාරය - ඍතු 6 නම් කිරීම, කර්තෘත්වය පිළිබඳ අදහස් හා අන්තර්ගතය (සැකෙවින්) මේඝදූතයඃ පූර්වමේඝ හා උත්තර මේඝ යන දෙකෙහි අන්තර්ගතය (සැකෙවින්) ගීතගෝවින්දය - අන්තර්ගතය (සැකෙවින්) පැහැදිලි කරන්න.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ඛණ්ඩකාව්‍ය හා මහාකාව්‍ය අතර වෙනස්කම් පැහැදිලි කරන්න.
- ඍතුසංහාරයේ විස්තර වන ඍතු සයෙන් තෝරාගත් පද්‍යය කීපයක් ඇසුරින් කෘතිය පිළිබඳ සරල අවබෝධයක් ලබාදෙන්න.
- මේඝදූතයෙන් හා ගීතගෝවින්දයෙන් උපුටාගත් පද්‍ය කිහිපයක් ඇසුරින් එම කෘති පිළිබඳ සරල අවබෝධයක් ලබාදෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ඛණ්ඩකාව්‍යයක් යනු කුමක් දැයි විස්තර කරයි.
- ඛණ්ඩකාව්‍යවල ඇති සාහිත්‍යාත්මක බව අවබෝධ කරගනියි.
- ඓතිහාසික කතා පුවත් ආශාවෙන් සොයා කියවයි.
- අරුත් කියවීමට හා අවබෝධ කරගැනීමට කැමැත්ත පළ කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ.
- සංස්කෘත ඛණ්ඩකාව්‍ය කෘති කීපයක්.

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, තිලකසිරි, ජයදේව.ඃ කොළඹ, 1961,

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය හැඳින්වීම

නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වාදීමේ දී ඔබ අතට පත් කොට මෙතෙක් ඔබ පරිශීලනය කළ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් පාසල පදනම් කරගත් තක්සේරුකරණය පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදාගත යුතු බවත් සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූල ධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම් ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත් ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කරගැනීමට යොදාගත හැකි වැඩ පිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කරගෙන තිබේ දැයි තහවුරු කරගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝප-දේශකත්වය ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණයය (feed Forward) යනුවෙනි. සිසුන්ගේ ප්‍රබලතා හා දුබලතා අනාවරණය කොටගෙන ඒවා වැඩි දියුණු කිරීම ඉදිරි පෝෂණයෙන් අපේක්ෂිත ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වූයේ දැයි හඳුනාගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මෙ සඳහා යොදාගත හැකි හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය යි.

යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදාගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදාගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයක් සම්බන්ධයෙන් සෑම විෂය ඒකකයකට ම යොදාගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරාගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය; වග බලාගත යුතු ය. එහි දී පහත වගුවෙහි දැක්වෙන ආකාරයට උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය ః- තෙවැනි වාරය
2. ආධාරක අංකය ః- 01
3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම ః- 10.2
4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය ః- වීරකාව්‍ය සාහිත්‍යය හාඳුනාගනියි.
5. ආධාරකයේ ස්වභාවය ః- බිත්ති පුවත්පතක් සැකසීම
6. ආධාරකයේ අරමුණු ః-

- වීරකාව්‍ය සාහිත්‍යය පිළිබඳ හැදෑරීමට යොමු කිරීම
- කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ සැකෙවින් හඳුනාගැනීම
- පුද්ගල චරිත මැනවින් වටහාගෙන ජීවිතාරෝපණය කරගැනීම
- සාහිත්‍ය තුළ වීරකාව්‍ය සඳහා හිමි ව ඇති ස්ථානය වටහාගැනීම
- තමා තුළ ආත්ම විශ්වාසය ගොඩනැගීම
- පරාර්ථචර්යාව පුහුණු කිරීම

7.ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් ః-

- පන්තියේ සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා එක් එක් කණ්ඩායමට වෙන වෙන ම මාතෘකා ලබා දී ඒ ඒ මාතෘකාවට අදාළ ලිපි සකස් කිරීමට උපදෙස් දෙන්න.
- මාතෘකාවට අදාළ චිත්‍ර ඇඳීමට උපදෙස් දෙන්න.
- ලිපි හා චිත්‍ර එකතු කිරීමට නිශ්චිත කාල රාමුවක් ලබාදෙන්න.
- අදාළ නිර්ණායකයන්ට ලකුණු ලබාදෙන්න.

සිසු උපදෙස් ః-

- තම කණ්ඩායමට නිර්මාණය කිරීමට නියමිත ලිපි හා චිත්‍ර ගුරුවරයා හා සාකච්ඡා කොට තීරණය කරන්න.
- වීරකාව්‍ය සාහිත්‍යය පිළිබඳ ලිය වී ඇති ග්‍රන්ථ හා ලිපි එක්රැස් කරන්න.
- නිර්ණායක මැනවින් තේරුම් ගෙන උසස් ලෙස කණ්ඩායමේ කාර්යය සිදු කරන්න.

| නිර්ණායකය<br><br>සිසුන්ගේ නම් | මාතෘකාවට අදාළ බව | කරුණුවල නිවැරදි බව | ලිපි පිළිවෙළ සැකසීම | දත්තවල ප්‍රමාණාත්මක බව | නිර්මාණාත්මක බව | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1<br><br>2<br><br>3 | | | | | | |

**ලකුණු පරාසය**

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතු ය 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කළ යුතු ය. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

9-10 විශිෂ්ට මට්ටමේ නිපුණතාව

8- ඉහළ මට්ටමේ නිපුණතාව

6-7 සම්මාන මට්ටමේ නිපුණතාව

4-5 ආසන්න මට්ටමේ නිපුණතාව

---- නිපුණතාවට ළඟා නොවූ

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කරගත හැකි ය.